සත්කාරයේ විශිෂ්ටත්වය

# වාර්ෂික වාර්තාව
# 2013

**ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය**
**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

# පටුන


| | | |
|---|---|---|
| හැඳින්වීම | - | 03 |
| ආයතනයේ දැක්ම, මෙහෙවර සහ ඉලක්ක | - | 04 |
| සංස්ථාපිත තොරතුරු | - | 07 |
| අධ්‍යක්ෂක මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | - | 08 |
| අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය | - | 10 |
| වර්ෂය තුළ කාර්ය සාධනය | - | 12 |
| සිසුන් පුහුණුකිරීම පිළිබඳ සාරාංශය - 2012/2013 | - | 15 |
| ආයතනය විසින් පවත්වන ලද අනෙකුත් වැඩසටහන් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් | - | 23 |
| මණ්ඩල රැස්වීම් සහ විගණන හා කළමනාකරණ රැස්වීම් | - | 36 |
| අනුමත අයවැය - 2013 වර්ෂය | - | 37 |
| මූල්‍ය ප්‍රකාශන | - | 42 |
| විගණකාධිපතිගේ නිරීක්ෂණ | - | 53 |

# හැඳින්වීම

2016 වර්ෂය වන විට සංචාරකයින් මිලියන 2.5 ක් පමණ පැමිණෙනු ඇතැයි යන්න ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ අපේක්ෂාවයි. සංචාරකයින්ගේ පැමිණීමේ සුවිශාල වර්ධනය හේතුවෙන් කර්මාන්තය තුළ සේවය කිරීම සඳහා 600,000 ක පමණ ඇස්තමේන්තුගත කාර්යබලකායක් අවශ්‍ය වනු ඇත. පවත්නා යාන්ත්‍රණය තුළ වාර්ෂිකව 2000 ක පමණ පුහුණු පිරිසක් පමණක් බිහිකරන හෙයින් අනිවාර්යය මිනිස්බල හිගයක් ඇතිවන බව පෙනේ.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය රටේ ජාතික සංචාරක පුහුණු ආයතනය වශයෙන් ආගන්තුක සත්කාර සහ සංචාරක පුහුණු ලබාදීම පිළිබඳ සුවිශේෂී දැක්මින් යුක්තව වෙළඳපොල මූලික, ගුණාත්මක භාවය සහතික කරන ලද හෝටල් සහ සංචාරක පුහුණු නිමැවුම් මාලාවක් පුළුල් ඉලක්කගත කණ්ඩායමකට පිරිනැමීම හරහා එකී හිඟය පියවීම සඳහා කටයුතු කිරීමට මහත් උනන්දුවෙන් පසුවේ.

කොළඹ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය තුළ ප්‍රමිතියෙන් යුත් කාමර 12 කින් සහ හෝටල් කාමර පේළියකින් සමන්විත අවශ්‍යතාවයට අනුකූලව ඉදිකරන ලද හෝටල් පාසැලක පිහිටා ඇත. පොදු අවන්හල සහ බීම හල වූ කලී අංක 78, ගාලුපාර කොළඹ 03 යන ස්ථානයේ පිහිටි “හෝටල් සමුද්‍රා” යන නමින් යුත් පුහුණු හෝටලයට එකතු කරන ලද අංගයන් ය. මෙය වූ කලී පෙර “Saffton” හෝටලය පිහිටි පරිශ්‍රමය වේ.

කොළඹ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ තාහිර් ශ්‍රවණාගාරය තුළ සමුළු සහ ව්‍යාපාරික රැස්වීම් පැවැත්වීමට පහසුකම් සපයනු ලබයි. වායු සමනය කරන ලද ශ්‍රවණාගාරය 250 ක පමණ පිරිසකට අසුන්ගත හැකි අනුක්‍රමික ආසන පන්තියකින් යුක්ත වන අතර විශාල වේදිකාව, අනර්ග ධ්වනි, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණවලින් සමන්විත නෘත්‍යාගාරයක ආකාරයේ පහසුකම් සපයනු ලබයි.

සංචාරක පුහුණු කටයුතු පළාත් මට්ටමට රැගෙන යාම පිණිස මහනුවර, අනුරාධපුරය, කොග්ගල, බණ්ඩාරවෙල සහ රත්නපුර යන ප්‍රදේශවල පළාත් පාසැල් පිහිටුවන ලදී.

කොළඹ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය නවීනතා පහසුකම්වලින් යුත් සමන්විත ප්‍රායෝගික මුළුතැන්ගෙවල් දෙකකින් සමන්විත වේ. තවද, නවීන උපකරණ සහ පහසුකම් සහිත පුහුණු ආපනශාලා දෙකක් ද විවෘත බීම හලක් අන්තර්ගත පොදු අවන්හලක් ප්‍රායෝගික සැසි පැවැත්වීම සඳහා ස්ථාපිත කොට ඇත.

ශිෂ්‍යාන්ට ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පරිගණක විද්‍යාගාරයට ප්‍රවේශ වීමට ඉඩ ප්‍රස්ථා පවතී. සංචාරක දැනුම එක්තැන් වූ, ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධානතම පුස්තකාලය ද අප ආයතනය සතුව පවතී.

## අපගේ දැක්ම

"ආසියාවේ සංචාරක ව්‍යාපාර හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා විශිෂ්ට පුහුණුවීම් සහ අධ්‍යාපනය ලබාදීමේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම"

## අපගේ මෙහෙවර

- කර්මාන්තය සඳහා උසස් තත්වයෙන් යුත් සංචාරක වෘත්තිකයන් බිහිකිරීම පිණිස චාරිකා, සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර කළමනාකරණ පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම සහ ලබාදීම.
- කර්මාන්තයේ ගතික ප්‍රවණතාවය පිළබඳ අවධානය යොමුකරමින් සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර කර්මාන්තයේ ඉල්ලුම සපුරාලීම පිණිස අවශ්‍ය මිනිස්බල පුහුණුව ලබා දීම.
- ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාරය සහ එහි අගයන් විශ්ව මට්ටමින් ප්‍රවර්ධනය කරන අතරතුර ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සමානව සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාරය පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම.
- සංචාරක ව්‍යාපාර හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනයක් පවත්වාගෙන යන අතරතුරුම රටේ විවිධ පළාත්වල ජීවත්වන සියලුම තරුණ තරුණියන්ට සමාන අවස්ථා ලබාදීම සහ සමාන කාර්ය පරිසරයක් නිර්මාණය කිරීම.
- අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනය සැලසෙන පරිදි දේශීය සහ ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමඟ සම්බන්ධතාවය ගොඩනගා ගනිමින් සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාරය පිළිබඳ අධ්‍යාපනය ලබාදීමේ ශක්‍යතාවය ඉහළ නැංවීම.
- සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාරය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම මගින් විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීම.

# අපගේ ඉලක්ක

- 2016 වර්ෂය වන විට චාරිකා, සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය මිනිස්බල අවශ්‍යතා සපුරාලනුවස් ශ්‍රී ලාංකිකයන් 600,000 ක පමණ පුහුණු කිරීම.
- ජාතිකත්ව හා ජාත්‍යන්තරව ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ හෝටල් කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවා නියුක්ත කිරීම පිණිස මනා පරිපූර්ණ, උසස් තත්වයෙන් යුත් ශිෂ්‍යයින් බිහිකිරීම.
- සංචාරක ව්‍යාපාර සහ සත්කාර කර්මාන්තයේ හෝටල් මෙහෙයුම් කුසලතා, කළමනාකරණ ක්‍රම පිළිබඳව අවධානය යොමුකරමින් මෙන්ම වෙනස්වන විශ්ව ව්‍යාපාර පරිසරයක් තුළ අඛණ්ඩව අධ්‍යයනය සිදුකිරීම සඳහා අවශ්‍ය නිපුණතා පිළිබඳ අවධානය යොමු කරමින් වැඩසටහන් සහ අදාළ පාඨමාලා සකස් කිරීම.
- දේශිය සහ ලෝක සංචාරක කර්මාන්තයේ පවතින මානව සම්පත් අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරමින් නව සංචාරක ව්‍යාපාර අධ්‍යාපන වැඩසටහන් සකස් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඉහළින්ම පිළිගනු ලබන හා සලකනු ලබන සුදුසුකම්වලින් සමන්විත මනා කැපවීමෙන් යුත් වෘත්තිකයන් බිහි කිරීම.
- සුවිශේෂී අධ්‍යාපනික පරිචයන් ශිෂ්‍යයින්ට ලබාදීම සහ දීර්ඝකාලීනව අධ්‍යාපනික විශිෂ්ටතා අත්පත් කර ගැනීම පිණිස දිරිගැන්වීම.
- ඉදිරි තෙවසර තුළ දී ලෝක සංචාරක ව්‍යාපාර සංවිධාන ප්‍රමිත ලබාගැනීම.
- වර්ෂ දෙකක කාලයක් තුළ දී දේශීය හා ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ ජාලයක් තුළ උපාය මාර්ගික සංධාන, වරණයන් සහ පිළිගැනීම් හරහා පුළුල් ව්‍යාප්තියක් සහ නියෝජනයක් ලබා ගැනීම.
- වර්ෂයක් තුළ කාර්යමණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සහ ශක්‍යතා වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සලසාලනුවස් කැපවීමෙන් කටයුතු කරන මානව සම්පත් සංවර්ධන ඒකකයක් ඇතිකිරීම.
- විෂයමාලා සංවර්ධනය සහ පුහුණු ක්‍රමවේදයන් වරින් වර ප්‍රතිශෝධනය කිරීම මගින් ගෝලීය ප්‍රමිතින්ට අනුකූලවන පරිදි ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වර්තමාන සංචාරක ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් වැඩිදියුණු කිරීම.
- ඉදිරි තෙවසර තුළ දී ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක ව්‍යාපාර පහසුකම් සම්බන්ධයෙන් ප්‍රමිතීන් සහ අධීක්ෂණ කාර්ය රාමුවක් සකස් කිරීම මගින් 2005 ජාතික සංචාරක ව්‍යාපාර පනත මගින් දක්වන ලද ජාතික සංචාරක ව්‍යාපාර අධ්‍යාපන ප්‍රතිපත්ති ඉල්ලීම් පිළිබඳ අවධානය යොමු කිරීම.

## අපගේ තේමාව

"ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම තලයට රැගෙන යාම - ශ්‍රී ලාංකීය ආගන්තුක සත්කාර සේවයේ විශිෂ්ටත්වය කරා පිය නගන චාරිකාවක්"

## අපගේ හරයන්

- ගුණාත්මක බව - අපගේ ශිෂ්‍යයින්ට පළමු පන්තියේ පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් අපි ලබා දෙන්නෙමු.

- සමානාත්මවතාව - ඉහළ ජයග්‍රහණයක් සහ වර්ධනයක් සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සපුරාලීම සඳහා ජාති, ආගම්, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආර්ථික තත්ත්වය නොසලකා සෑම ශිෂ්‍යයෙකුටම සමාන අවස්ථා අපි ලබා දෙන්නෙමු.

- විශ්වසනීත්වය - සංචාරක ව්‍යාපාරයේ සහ ආගන්තුක සත්කාර සේවාවේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා වෘත්තිය ආචාරධර්ම සහ ශික්ෂණයන් ඉහළ තත්ත්වයකින් යුතුව පවත්වාගෙන යාමට අපි යත්න දරන්නෙමු.

## සංස්ථාපිත තොරතුරු

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ජාතික සංචාරක සංවිධානය වන ලංකා සංචාරක මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වූ ආයතනයක් වන අතර 2005 අංක 38 දරන නව සංචාරක ව්‍යාපාර පනත යටතේ 2007 ඔක්තෝබර් 01 වන දින සිට එය ස්වාධීන ආයතනයක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

කර්මාන්තය සඳහා උසස් තත්වයෙන් යුත් සංචාරක වෘත්තිකයන් බිහිකිරීම පිණිස චාරිකා, සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර කළමනාකරණ පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම සහ ලබාදීම ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ප්‍රධාන කාර්යය වේ. මෙම ආයතනය විසින් ඩිප්ලෝමා, කළමනාකරණ, සහතික පත්‍ර සහ ශිල්පීය මට්ටමේ පාඨමාලා පවත්වනු ලැබේ.

| | | |
|---|---|---|
| නම | - | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය. |
| නෛතික ස්වරූපය | - | 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. |
| ප්‍රධාන කාර්යාලය | - | 78, ගාලු පාර, කොළඹ. |

**ප්‍රාදේශීය පාසැල් :**

1. අනුරාධපුර හෝටල් පාසැල - ශ්‍රී මහා බෝධි මාවත, අනුරාධපුර.
2. බණ්ඩාරවෙල හෝටල් පාසැල - ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය, ගොල්ෆ් ලින්ක් පාර, බණ්ඩාරවෙල.
3. මහනුවර හෝටල් පාසැල - මහවැලි උයන පාර, වරාපිටිය, කුණ්ඩසාලේ.
4. කොග්ගල හෝටල් පාසැල - ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිය, කොග්ගල.
5. රත්නපුර හෝටල් පාසැල - නව නගරය, රත්නපුරය.

| | | |
|---|---|---|
| විගණකවරු | - | ශ්‍රී ලංකා විගණකාධිපති |
| බැංකුකරුවෝ | - | ලංකා බැංකුව |

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2013 වර්ෂයේ අධ්‍යක්ෂක මණ්ඩලය

(2005 අංක 38 දරන සංචාරක පනතේ iv වැනි වගන්තිය ප්‍රකාර)

**සභාපති**

චන්ද්‍රා මොහොට්ටි මහතා

**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්**

ජී. එස්. විජේවර්ධන මහතා

**ඇමතිවරයා විසින් නම් කරන ලද නියෝජිත**

බී. එස්. ගුණරත්න මහතා

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්**

ආචාර්ය ඩී. එස්. ජයවීර

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත**

හේමා ධර්මවර්ධන මිය

**ශ්‍රී ලංකා සංචාරක සංගම් නියෝජිත ආයතනයේ නියෝජිත**

එස්. පරමනාදන් මහතා

**ශ්‍රී ලංකා ගමනාන්ත චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ නියෝජිත**

ටී. එම්. එෆ්. පකීර් මහතා

**මහා භාණ්ඩාගාරයේ නියෝජිත**

එස්. එස්. මුදලිගේ මහතා

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2013 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

**අධ්‍යක්ෂ ජනරාල්**

ජී. එස්. විජේවර්ධන මහතා

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**

පී. එස්. කුලතුංග මහතා

**ලේඛකාධිකාරී**

එම්. ගනේගොඩ මහත්මිය

**විදුහල්පති**

රිසා ඩීන් මහතා

**වැඩබලන විදුහල්පති / ප්‍රාදේශීය පාසැල, මහනුවර**

ඉරන්දි විජේගුණවර්ධන මහත්මිය

**වැඩබලන විදුහල්පති / ප්‍රාදේශීය පාසැල, රත්නපුර**

කේ. එන්. ජයතුංග මහතා

# අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

| අංකය | තනතුරු නාමය | අනුමත | දැනට සිටින | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල්/ප්‍ර.වි.නි | 1 | 1 | 0 |
| 2. | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 0 | 1 |
| 3. | ලේඛකාධිකාරී | 1 | 1 | 0 |
| 4. | අධ්‍යක්ෂ (මූල්‍ය) | 1 | 0 | 1 |
| 5. | විදුහල්පති | 6 | 2 | 4 |
| 6. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 20 | 17 | 3 |
| 7. | කථිකාචාර්ය / සහකාර කථිකාචාර්ය | 40 | 35 | 5 |
| 8. | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | 3 | 2 | 1 |
| 9. | විධායක සහකාර * | 7 | 7 | 0 |
| 10. | වැඩසටහන් සම්බන්ධීකාරක | 1 | 1 | 0 |
| 11. | තාක්ෂණ නිලධාරී | 1 | 0 | 1 |
| 12. | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 13. | මූල්‍ය නිලධාරී | 1 | 0 | 1 |
| 14. | මිලදී ගැනීම් නිලධාරී | 1 | 1 | 0 |
| 15. | සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්ගේ පුද්ගලික සහායක | 1 | 0 | 1 |
| 16. | සංවර්ධන සහකාර (තාක්ෂණික) * | 1 | 4 | -3 |
| 17. | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 3 | 0 | 3 |
| 18. | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 25 | 17 | 8 |
| 19. | තාක්ෂණ සහකාර | 1 | 0 | 1 |
| 20. | රියදුරු | 4 | 3 | 1 |
| 21. | විදුලි කාර්මික * | 1 | 1 | 0 |
| 22. | කම්කරු | 5 | 1 | 4 |
| 23. | සහායක | 2 | 0 | 2 |
| 24. | සූපවේදී/සහකාර සූපවේදී | 2 | 2 | 0 |
| 25. | කාර්යාල සහායක | 4 | 5 | -1 |
| 26. | හැන්ඩිමෑන් | 1 | 0 | 1 |
| 27. | බහුකාර්ය කාර්මික ශිල්පී | 2 | 2 | 0 |
| | එකතුව | **137** | **103** | **34** |

සමුද්‍රා හෝටලය සහ මොනාරා ආපන ශාලාව

| අංකය | තනතුරු නාමය | අනුමත | දැනට සිටින | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | නේවාසික කළමනාකරු | 1 | 1 | 0 |
| 2. | ආහාර හා පාන කළමනාකරු | 1 | 1 | 0 |
| 3. | ප්‍රධාන සූපවේදී | 1 | 0 | 1 |
| 4. | සූපවේදී/සහකාර සූපවේදී | 4 | 4 | 0 |
| 5. | කැප්ටන් | 1 | 0 | 1 |
| 6. | ස්ටූවඩ්ස්/වේටර් | 4 | 0 | 4 |
| 7. | බාර්මන් | 1 | 0 | 1 |
| 8. | සහායක | 3 | 1 | 2 |
| 9. | කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) (පිළිගැනීමේ නිලධාරී/ දුරකථන ක්‍රියාකරු) | 2 | 0 | 2 |
| 10. | පොටර්/බෙල්බෝයි | 1 | 1 | 0 |
| 11. | ලිනන් කීපර් | 1 | 0 | 1 |
| 12. | රූම් බෝයි | 1 | 1 | 0 |
| 13. | එළිමහන් කම්කරු | 1 | 0 | 1 |
| 14. | කම්කරු | 1 | 0 | 1 |
| | **එකතුව** | **23** | **9** | **14** |

# වර්ෂය තුළ කාර්ය සාධනය

පහත සඳහන් පාඨමාලා පවත්වන ලදී.

අ). හෝටල් සහ ආහාරපාන සැපයීම පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

ආ). කළමනාකරණ වැඩසටහන් අරහයා යොමුවුණු සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා

- අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය
- ගෘහ පාලනය
- ආහාරපාන කළමනාකරණය
- වෘත්තීය සූපවේදී පාඨමාලාව

ඇ). ශිල්පීය මට්ටමේ පාඨමාලා

- ගෘහ පාලනය
- ආහාරපාන කළමනාකරණය
- වෘත්තීය සූපවේදී පාඨමාලාව

ඈ). පදනම් පාඨමාලා

- පේස්ට්‍රි හා බේකරි පාඨමාලා
- ලෝන්ඩ්‍රි කළමනාකරණ

ඉ) සංචාරක මඟ පෙන්වන්නන් පුහුණු කිරීමේ පාඨමාලා

- ජාතික / චාරිකා රියදුරු මඟපෙන්වීම් පාඨමාලාව
- ප්‍රාදේශීය / ස්ථානීය චාරිකා රියදුරු මඟපෙන්වීම් පාඨමාලාව

උසස් මට්ටමේ පාඨමාලා, අන්තර් මධ්‍ය මට්ටමේ පාඨමාලා සහ කළමනාකරණ පාඨමාලා කොළඹ හෝටල් පාසැලේදී පවත්වනු ලැබේ. සහතික පත්‍ර මට්ටමේ සහ ශිල්පීය මට්ටමේ පාඨමාලා කොළඹ හා ප්‍රාදේශීය පාසැල්වලදී පවත්වනු ලැබේ. ලොන්ඩ්‍රි කළමනාකරණය, ප්‍රේස්ට්‍රි සහ බේකරි පාඨමාලා 2013 වර්ෂයේදී හඳුන්වාදෙනු ලැබූ නව පාඨමාලාවන්ය.

# විෂයමාලා සංවර්ධනය

ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පවතින වර්තමාන ප්‍රවණතාවය සහ අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගෙන පහත සඳහන් විෂයන් 11 ට අදාළව විෂයමාලා සංවර්ධනය සිදුකරන ලදී.

1. සංචාරක කළමනාකරණය
2. MICE සහ වැඩසටහන් කළමනාකරණය
3. ස්පා සහ නිදහස් සංචාරක ව්‍යාපාරය
4. ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය
5. සංචාරක මඟපෙන්වීම
6. චාරිකා සහ සංචාර කළමනාකරණය
7. ගෘහ පාලනය
8. අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය
9. ප්‍රේස්ට්‍රි සහ බේකරි
10. වෘත්තීය සූපශාස්ත්‍ර සහ ඉවුම් පිහුම් කලාව
11. ආහාර පාන කළමනාකරණය

සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 225 ක් ආයෝජනය කර මහනුවර හෝටල් පාසැල ඉදිකිරීම මෙන්ම රුපියල් මිලියන 106.8 ක වියදමක් දරා ශිෂ්‍යයින්ගේ පුහුණුවීම්වලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, ආගන්තුක සත්කාරක සේවය ලද විශිෂ්ට ජයග්‍රහණයකි. වසර මැද දී සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් නව හෝටල් පාසැල විවෘත කරනු ලැබූ අතර මධ්‍යම පළාත් සභාවෙන් ලබාගන්නා ලද පරිශ්‍රයක ක්‍රියාත්මක වූ හෝටල් පාසැලේ සියලුම කටයුතු නව හෝටල් පාසැල් පරිශ්‍රය වෙත රැගෙන යන ලදී. අමාත්‍යාංශයට අයත් භූමියක නව පරිශ්‍රය ඉදිකරන ලදී.

විෂයන් හතරකට අදාලව (ගෘහ පාලනය, වෘත්තීය සූප ශාස්ත්‍රය, අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය සහ ආහාර පාන කළමනාකරණය) පවත්වන ලද ශිල්පීය මට්ටමේ සහ සහතික පත්‍ර මට්ටමේ සියලුම පාඨමාලා වැඩි පහසුකම් යටතේ පවත්වන ලදී. 2012 වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේ පුහුණුව ලත් ශිෂ්‍යයින් සංඛ්‍යාව 245 සිට 318 දක්වා වූ වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර එය 29.7% ක වර්ධනයකි.

## 2013 වර්ෂයේ මැයි මස 15 වැනි දින මහනුවර හෝටල් පාසැල උත්සවශ්‍රීයෙන් විවෘත කිරීම



ආරාධිත අමුත්තන් පිළිගැනීම



ඵලකය නිරාවරණය කිරීම




ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා සභාව ඇමතීම




මහනුවර ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ශිෂයින්ගේ ප්‍රසංගය

විෂයන් අනුව සහ ප්‍රාදේශීය පාසැල් අනුව පවත්වන ලද මූළු පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත වගු මගින් දක්වා ඇත.

වගුව 01 - 2012/2013 වර්ෂයේදී පුහුණු කරන ලද සිසුන් පිළිබඳ සාරාංශය

වගුව 02 - 2012/2013 වර්ෂයේදී පුහුණු කරන ලද සිසුන් පිළිබඳ ප්‍රස්ථාරගත සාරාංශය

වගුව 03 - කොළඹ හෝටල් පාසැලේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

වගුව 04 - මහනුවර හෝටල් පාසැලේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

වගුව 05 - බණ්ඩාරවෙල හෝටල් පාසැලේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

වගුව 06 - අනුරාධපුර හෝටල් පාසැලේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

වගුව 07 - රත්නපුර හෝටල් පාසැලේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

වගුව 08 - කොග්ගල හෝටල් පාසැලේ සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම


වගුව - 01

# <u>සිසුන් පුහුණු කිරීම පිළිබඳ සාරාංශය - 2012 / 2013</u>

| වැඩසටහන | කොළඹ | | අනුරාධපුර | | මහනුවර | | කොග්ගල | | බණ්ඩාරවෙල | | රත්නපුර | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** |
| පදනම් පාඨමාලාව | - | 18 | - | - | - | - | - | - | - | - | - | - | - | **18** |
| ශිල්පීය මට්ටම | 106 | 160 | 45 | 32 | 20 | 56 | 35 | 18 | 12 | 14 | 48 | 100 | **266** | **380** |
| සහතික පත්‍ර මට්ටම | 310 | 501 | 74 | 107 | 225 | 262 | 218 | 237 | 71 | 153 | 176 | 190 | **1074** | **1450** |
| අන්තර් මධ්‍ය මට්ටම | 70 | 50 | - | - | - | - | - | - | - | - | - | - | **70** | **50** |
| උසස මට්ටම | 64 | 42 | - | - | - | - | - | - | - | - | - | - | **64** | **42** |
| තුන් අවුරුදු කළමනාකරණ මට්ටම | 43 | 38 | - | - | - | - | - | - | - | - | - | - | **43** | **38** |
| **මුළු එකතුව** | **593** | **809** | **119** | **139** | **245** | **318** | **253** | **255** | **83** | **167** | **224** | **290** | **1517** | **1960** |

වගුව - 02

**2012 සිට 2013 වර්ෂය දක්වා ශිෂ්‍යයින් පුහුණු කිරීම පිළිබඳ සාරාංශය**




| | Colombo | A'pura | B'wela | Kandy | Koggala | Ratnapura | |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 514 | 76 | 139 | 208 | 273 | 257 | |
| 2012 | 593 | 119 | 83 | 245 | 253 | 224 | |
| 2013 | 809 | 139 | 176 | 318 | 255 | 290 | |

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2011 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයට අදාලව පුහුණු කරනු ලැබූ ශිෂ්‍යයින් ප්‍රමාණයේ වර්ධනයක් පහත සඳහන් පරිදි ඇතිකර ගැනීමට ආයතනයට හැකි විය. 2011 වර්ෂයේදී ශිෂ්‍යයින් 1467 ක් පුහුණු කරනු ලැබූ අතර 2012 වර්ෂයේදී එම ප්‍රමාණය 1517 දක්වා වර්ධනය විය. 2013 වර්ෂයේදී මෙම ක්ෂේත්‍රයට අදාලව පුහුණු කරනු ලැබූ ශිෂ්‍යයින් සංඛ්‍යාව 1960 දක්වා වර්ධනය විය. එය 2012 වර්ෂය හා සැසඳීමේදී 29.2 % ක වර්ධනයකි.

වගුව - 03

## ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම - කොළඹ හෝටල් පාසැල

| වැඩසටහන | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම |
| පදනම් පාඨමාලා | | | | |
| පේස්ට්‍රි හා බේකරි | - | - | 20 | 14 |
| ලොන්ඩ්‍රි මෙහෙයුම් | - | - | 10 | 4 |
| | - | - | 30 | 18 |
| ශිල්පීය මට්ටම | | | | |
| ගෘහ පාලනය | 32 | 25 | 41 | 39 |
| ආහාර පාන කළමනාකරණය | 45 | 37 | 69 | 54 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 59 | 44 | 72 | 67 |
| එකතුව | 136 | 106 | 182 | 160 |
| සහතික පත්‍ර මට්ටම | | | | |
| ගෘහ පාලනය | 82 | 75 | 150 | 137 |
| ආහාර පාන කළමනාකරණය | 102 | 98 | 141 | 132 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 78 | 76 | 136 | 129 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | 71 | 61 | 128 | 103 |
| එකතුව | 333 | 310 | 555 | 501 |
| අන්තර් මධ්‍ය මට්ටම | | | | |
| ගෘහ පාලනය | 8 | 8 | 3 | 3 |
| ආහාර පාන කළමනාකරණය | 19 | 19 | 24 | 20 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 24 | 24 | 17 | 15 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | 21 | 19 | 13 | 12 |
| එකතුව | 72 | 70 | 57 | 50 |
| උසස් මට්ටම | | | | |
| උපකාරක සේවා මෙහෙයුම් | 24 | 23 | 15 | 11 |
| ආහාර පාන කළමනාකරණය | 19 | 19 | 20 | 19 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 23 | 22 | 13 | 12 |
| එකතුව | 66 | 64 | 48 | 42 |
| තුන් අවුරුදු කළමනාකරණ මට්ටම | 53 | 43 | 41 | 38 |
| එකතුව | 53 | 43 | 41 | 38 |
| **මුළු එකතුව** | **660** | **636** | **913** | **809** |

කොළඹ හෝටල් පාසැල විසින් 2012 වසරේ සිට 2013 වසර දක්වා පුහුණු කරනු ලැබු ශිෂ්‍යයින් ප්‍රමාණය ඉහත වගුව මගින් පෙන්නුම් කෙරේ. ඉහත සංඛ්‍යා පිළිබඳ සැලකිල්ල යොමු කිරීමේදී පුහුණු කරනු ලැබු සිසුන් ප්‍රමාණය 636 සිට 809 ක් දක්වා වර්ධනය වී ඇති බව පෙනේ. එය වු කළී 2012 වර්ෂය හා සැසඳීමේදී 27.2 % ක වර්ධනයකි.

වගුව - 04

**මහනුවර හෝටල් පාසැල - සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම**

| වැඩසටහන | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම |
| ශිල්පීය මට්ටම | | | | |
| ගෘහ පාලනය | - | - | 15 | 15 |
| ආහාර පාන කළමනාකරණය | - | - | 19 | 18 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 24 | 20 | 24 | 23 |
| එකතුව | 24 | 20 | 58 | 56 |
| සහතික පත්‍ර මට්ටම | | | | |
| ගෘහ පාලනය | 63 | 58 | 76 | 70 |
| ආහාර පාන කළමනාකරණය | 63 | 56 | 85 | 72 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 65 | 64 | 93 | 75 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | 54 | 47 | 53 | 45 |
| එකතුව | 245 | 225 | 307 | 262 |
| **මුළු එකතුව** | **269** | **245** | **365** | **318** |

මහනුවර හෝටල් පාසැල විසින් 2012 වසරේ සිට 2013 වසර දක්වා පුහුණු කරනු ලැබු ශිෂ්‍යයින් ප්‍රමාණය ඉහත වගුව මඟින් පෙන්නුම් කෙරේ. 2012 වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේදී පුහුණු කරන ලද සිසුන් ප්‍රමාණය 318 දක්වා වර්ධනය වී ඇත. එය වු කළී 2012 වර්ෂය හා සැසඳීමේදී 29.7% ක වර්ධනයකි.

වගුව – 05

## බණ්ඩාරවෙල හෝටල් පාසැල - සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

| වැඩසටහන | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම |
| ශිල්පීය මට්ටම | | | | |
| ගෘහ පාලනය | 13 | 12 | - | - |
| ආහාර පාන කළමනාකරණය | - | - | - | - |
| වෘත්තීය සූපශාස්ත්‍රය | - | - | 19 | 14 |
| එකතුව | 13 | 12 | 19 | 14 |
| සහතික පත්‍ර මට්ටම | | | | |
| ගෘහ පාලනය | 38 | 18 | 34 | 30 |
| ආහාර පාන කළමනාකරණය | 39 | 18 | 42 | 35 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 48 | 24 | 50 | 46 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | 29 | 11 | 50 | 42 |
| එකතුව | 154 | 71 | 176 | 153 |
| **මුළු එකතුව** | **167** | **83** | **195** | **167** |

බණ්ඩාරවෙල හෝටල් පාසැල විසින් 2012 වසරේ සිට 2013 වසර දක්වා පුහුණු කරනු ලැබූ සිසුන් ප්‍රමාණය ඉහත වගුව මඟින් පෙන්නුම් කෙරේ. පුහුණුව ලද සිසුන් ප්‍රමාණය 83 සිට 167 දක්වා වර්ධනය වී ඇත. එය වූ කලී 2012 වර්ෂය හා සැසඳීමේදී 100.1 % ක වර්ධනයකි.

වගුව - 06

## අනුරාධපුර හෝටල් පාසැල - සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

| වැඩසටහන | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම |
| ශිල්පීය මට්ටම | | | | |
| ගෘහ පාලනය | 32 | 32 | 12 | 09 |
| ආහාර පාන කළමනාකරණය | - | - | 10 | 09 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 14 | 13 | 14 | 14 |
| එකතුව | 46 | 45 | 36 | 32 |
| සහතික පත්‍ර මට්ටම | | | | |
| ගෘහ පාලනය | - | - | 08 | 08 |
| ආහාර පාන කළමනාකරණය | 23 | 23 | 36 | 33 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 55 | 51 | 55 | 47 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | - | - | 25 | 19 |
| එකතුව | 78 | 74 | 124 | 107 |
| **මුළු එකතුව** | **124** | **119** | **160** | **139** |

අනුරාධපුර හෝටල් පාසැලේදී 2012 සිට 2013 වසර දක්වා පුහුණුව ලැබූ ශිෂ්‍යයින් සංඛ්‍යාව ඉහත වගුවෙන් පෙන්නුම් කෙරේ. ඉහත සංඛ්‍යා පිළිබඳ සැලකීමේදී පුහුණුව ලද සිසුන් ප්‍රමාණය 119 සිට 139 දක්වා වර්ධනය වී ඇති බව පෙනේ. එය වූ කලී 2012 වර්ෂය හා සැසඳීමේදී 16.8% ක වර්ධනයකි.

වගුව - 07

## රත්නපුර හෝටල් පාසැල - සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

| වැඩසටහන | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම |
| ශිල්පීය මට්ටම | | | | |
| ගෘහ පාලනය | 15 | 13 | 41 | 25 |
| ආහාර පාන කළමනාකරණය | 18 | 16 | 48 | 31 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 19 | 19 | 46 | 44 |
| එකතුව | 52 | 48 | 135 | 100 |
| සහතික පත්‍ර මට්ටම | | | | |
| ගෘහ පාලනය | 45 | 40 | 49 | 45 |
| ආහාර පාන කළමනාකරණය | 61 | 48 | 62 | 62 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 68 | 56 | 52 | 49 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | 36 | 32 | 32 | 30 |
| එකතුව | 210 | 176 | 195 | 186 |
| **මුළු එකතුව** | **262** | **224** | **330** | **286** |

රත්නපුර හෝටල් පාසැලේදී 2012 සිට 2013 වසර දක්වා පුහුණුව ලැබූ ශිෂ්‍යයින් සංඛ්‍යාව ඉහත වගුවෙන් පෙන්නුම් කෙරේ. ඉහත සංඛ්‍යා පිළිබඳ සැලකීමේදී පුහුණුව ලද සිසුන් ප්‍රමාණය 224 සිට 286 දක්වා වර්ධනය වී ඇති බව පෙනේ. එය වූ කලී 2012 වර්ෂය හා සැසඳීමේදී 27.6% ක වර්ධනයකි.

වගුව – 08

## කොග්ගල හෝටල් පාසැල - සිසුන් ඇතුළත් කර ගැනීම සහ නිමැවුම

| වැඩසටහන | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ශිෂ්‍යයින් ලියාපදිංචිය | නිමැවුම | | ශිෂ්‍යයින් ලියාපදිංචිය |
| ශිල්පීය මට්ටම | | | | |
| ගෘහ පාලනය | 10 | 08 | - | - |
| ආහාර පාන කළමනාකරණය | 13 | 11 | - | - |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 16 | 16 | 21 | 18 |
| එකතුව | 39 | 35 | 21 | 18 |
| සහතික පත්‍ර මට්ටම | | | | |
| ගෘහ පාලනය | 51 | 51 | 70 | 62 |
| ආහාර පාන කළමනාකරණය | 45 | 41 | 66 | 53 |
| වෘත්තීය සූපශාස්ත්‍රය | 62 | 55 | 58 | 49 |
| අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය | 69 | 71 | 84 | 73 |
| එකතුව | 227 | 218 | 278 | 237 |
| **මුළු එකතුව** | **266** | **253** | **299** | **255** |

කොග්ගල හෝටල් පාසැලේ දී 2012 සිට 2013 වසර දක්වා පුහුණුව ලැබූ ශිෂ්‍යයින් සංඛ්‍යාව ඉහත වගුව මගින් පෙන්නුම් කෙරේ.ඉහත සංඛ්‍යා පිළිබඳ සැලකීමේදී පුහුණුව ලද සිසුන් සංඛ්‍යාව 253 සිට 255 දක්වා වැඩි වී ඇති බව පෙනේ.

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලද අනෙකුත් වැඩසටහන් සහ විෂය බාහිර ක්‍රියාකාරකම්

## කොළඹ හෝටල් පාසැල

| අංකය | වැඩසටහන | සංවිධානය | කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - මුළුතැන්ගෙය, ආහාර පාන කළමනාකරණය, ගෘහ පාලනය, අමුත්තන් පිළිගැනීමේ | • ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 2013-01-21<br>2013-05-02<br>2013-08-27 | 99 |
| 02 | පාරිභෝගික සත්කාරය පිළිබඳ වැඩසටහන | • ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>• සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 2013-02-09<br>2013-06-09 | 10<br>40 |
| 03 | ශ්‍රී ලංකා නාවික හමුදාවේ උප ලුතිනන්වරුන් සඳහා පවත්වන ලද ආහාර පිළිගැන්වීම සහ බොජුන්හල් කළමනාකරණය පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | 2013 සැප්තැම්බර් 9 සිට 31 දක්වා | 20 |
| 04 | දැනුවත් කිරීමේ වැඩසටහන | ත්‍රිකුණාමලය ශ්‍රී ලංකා නාවික ඇකඩමිය | 2013-09-27 | 33 |
| 05 | සංචාරක ප්‍රදේශ මඟපෙන්වීම් පුහුණු වැඩසටහන | බස්නාහිර පළාත<br>උතුරුමැද පළාත | 2013 ජුනි සිට ජූලි දක්වා<br>2013 දෙසැම්බර් | 40<br>39 |

මහනුවර හෝටල් පාසැල

| අංකය | වැඩසටහන | සංවිධානය | කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ශිෂ්‍යයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | • රඹුක්කන සුජාතා විද්‍යාලය<br>• මහනුවර සිරිමල්වත්ත විද්‍යාලය<br>• මහනුවර විද්‍යාරත්න විද්‍යාලය | 2013-02-11<br>2013-03-28<br>2013-04-26 | 100 |
| 02 | මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන බලපෑම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ශිෂ්‍යයන් | 2013-03-05 සහ 2013-08-06 | 40 |
| 03 | මහනුවර අධ්‍යාපන කළාපයේ ගෘහ ආර්ථික විද්‍යා ගුරුවරුන් සඳහා පුහුණුව | මහනුවර රජයේ පාසැල් | 2013 අප්‍රේල් 3 සිට 5 දක්වා | 30 |
| 04 | ශ්‍රී ලංකා හමුදාවේ හමුදා නිලධාරීන් 30 දෙනෙකු සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකා හමුදාව | 2013 ඔක්තෝම්බර් 09 | 30 |

කොග්ගල හෝටල් පාසැල

| අංකය | වැඩසටහන | සංවිධානය | කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ශ්‍රමදාන කඳවුර | කොග්ගල ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ශිෂ්‍යයින්ගේ ක්‍රීඩා හා සුභසාධක සංගමය | 2013-07-26 | 150 |
| 02 | ලෝක සංචාරක දිනය | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 2013-09-27 | 300 |
| 03 | රැකියා වෙළඳපොළ - මාතර | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2013-09-28 | 200 |
| 04 | එච්.අයි.වී පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කොග්ගල ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ශිෂ්‍යයින්ගේ ක්‍රීඩා හා සුභසාධක සංගමය | 2013-10-21 | 150 |
| 05 | රැකියා වෙළඳපොළ - ගාල්ල | ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2013-11-19 සිට 21 | 400 |
| 06 | රැකියා වෙළඳපොළ - වැලිගම | වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2013-12-21 | 150 |
| 07 | රැකියා වෙළඳපොළ - තවලම | තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2013-12-22 | 300 |

**බණ්ඩාරවෙල හෝටල් පාසැල**

| අංකය | වැඩසටහන | සංවිධානය | කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | දැනුවත් කිරීමේ වැඩසටහන | මො/ මැදිරිය මහා විද්‍යාලය<br>මො/ කුඹුක්කන මහා විද්‍යාලය<br>ලාහුගල මහා විද්‍යාලය<br>බිබිල නාන්නපුර මහා විද්‍යාලය<br>බණ්ඩාරවෙල යොවුන් සේනාංකය<br>වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැකියා අපේක්ෂකයින්<br>බණ්ඩාරවෙල ධර්මපාල විද්‍යාලය | මැයි 29<br>මැයි 3<br>ඔක්තෝම්බර් 15<br>ඔක්තෝම්බර් 22<br>ඔක්තෝම්බර් 24<br>මාර්තු 19<br>ඔක්තෝම්බර් 01 | 25<br>18<br>28<br>25<br>18<br>300<br>350 |
| 02 | ඌව හෝටල්කරුවන්ගේ පුහුණු වැඩසටහන | ඌව හෝටල් සේවකයන් | 2013 ඔක්තෝම්බර් 04- 06 | 50 |
| 03 | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිසුන් | 2013 මාර්තු 19 | 10 |

**අනුරාධපුරය හෝටල් පාසැල**

| අංකය | වැඩසටහන | සංවිධානය | කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ ප්‍රතිලාභ-පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මාර්තු 19 | 10 |
| 02 | ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ වැඩසටහන - ජාතික යොවුන් සේනාංකය, පලාඩිකුලම, අනුරාධපුරය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මාර්තු 20,21,22,27 | 80 |
| 03 | අම්පාර 2013 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සහභාගී වීම. | - | 2013 මාර්තු 20-30 | 10 |
| 04 | “වරිග මංගලාය”ප්‍රදර්ශනයට සහභාගී වූවන් සඳහා පවත්වන ලද ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහන සහ ආහාර මේස ආචාර ධර්ම පිළිබඳ වැඩසටහන | රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය . | 2013 අප්‍රේල් 04,05 | 300 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | අනුරාධපුර කේම්බ්‍රිජ් භාෂා පුහුණු ආයතනය සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 අප්‍රේල් 09 | 19 |
| 06 | අනුරාධපුර නිවන්තකචෛත්‍ය පාසැලේදී පවත්වන ලද පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 අප්‍රේල් 30 | 19 |
| 07 | හෝටල් ගෘහ පාලනය පිළිබඳ විශේෂ මූලික මට්ටමේ පාඨමාලාව | නැගෙනහිර පළාත් සභාව විසින් තෝරාගන්නා ලද සහභාගීවූවන් සඳහා පවත්වන ලද වැඩසටහන | 2013 මැයි 06 | 30 |
| 08 | හෝටල් කර්මාන්තයට හඳුන්වා දීමක් රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 02,03 සහ 07 | 50 |
| 09 | ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් - ශ්‍රී ලංකා ටෙලිකොම් | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 07 | 10 |
| 10 | පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන අ/ ස්වර්ණපාලි බාලිකා විද්‍යාලය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 08 | 20 |
| 11 | ගිනි සහ ජීවිතාරක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය සහ ගිනි නිවීමේ හමුදාව සඳහා පවත්වන ලද දිවා ආහාරය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 09 | 04 |
| 12 | ආහාර පාන කළමනාකරණය මෙහෙයුම් පිළිබඳ සම්මන්ත්‍රණය සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා දිවා ආහාරය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 10 | 20 |
| 13 | අ/ පෙරිමියන්කුලම ම.වි. සඳහා පැවැත් වූ සම්මන්ත්‍රණය සහ දිවා ආහාරය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 14 | 20 |
| 14 | අ/ වලිසිංහ හරිස්චන්ද්‍ර ම.වි. සඳහා පැවැත් වූ සම්මන්ත්‍රණය සහ දිවා ආහාරය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 16 සහ 17 | 40 |
| 15 | අ/ මන්කඩවල ම.වි. සඳහා පැවැත් වූ දේශනය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 21 | 20 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | අ/ නිවන්තක චේතිය ම.වි. සඳහා පැවැත් වූ දේශනය සහ දිවා ආහාරය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 මැයි 23 | 20 |
| 17 | රැකියා / වෘත්ති වෙළඳපොල | අ/ නිවන්තකචේතිය ම.වි. | 2013 ජූලි 27 | 05 |
| 18 | උත්සවයක් සඳහා කටයුතු කිරීමට ශිෂ්‍යයින් යෙදවීම | දඹුල්ල ග්‍රීන් පැරඩයිස් හෝටලය | 2013 අගෝස්තු 01 | 09 |
| 19 | ශ්‍රී ලංකා හමුදා සේවා බලකා පාසැල සඳහා පවත්වන ලද ආහාරපාන මෙහෙයුම් සහ මුළුතැන්ගෙයි මෙහෙයුම් පිළිබඳ යොමු කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 අගෝස්තු 02 | 30 |
| 20 | ශ්‍රී ලංකා හමුදා සේවා බලකා පාසැල සඳහා පවත්වන ලද ආහාරපාන මෙහෙයුම් සහ මුළුතැන්ගෙයි මෙහෙයුම් පිළිබඳ යොමු කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 අගෝස්තු 05 | 30 |
| 21 | හුරුකරවීමේ චාරිකා (වෘත්තීය සූප ශාස්ත්‍රය) | සිනමන් ලොඩ්ජ් - හබරන | 2013 අගෝස්තු 07 | 22 |
| 22 | හුරුකරවීමේ වැඩසටහන (ගෘහපාලන සහ පිළිගැනීමේ නිලධාරී) | වායා ඕලූ හෝටලය - ත්‍රිකුණාමලය | 2013 අගෝස්තු 08 | 17 |
| 23 | පෞර්ෂත්ව සංවර්ධන පිළිබඳ දේශනය | ජාතික යොවුන් සේනාංකය පලාඩිකුලම, අනුරාධපුරය | 2013 අගෝස්තු 21 | 01 |
| 24 | උත්සවයක් සඳහා කටයුතු කිරීමට ශිෂ්‍යයින් යෙදවීම. | පොලොන්නරුව සුදු අරලිය හෝටලය | 2013 අගෝස්තු 24 | 06 |
| 25 | මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 අගෝස්තු 30 | 12 |
| 26 | ගිනි නිවීම පිළිබඳ සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013 අගෝස්තු 30 | 50 |
| 27 | වෘත්තීය සූප ශාස්ත්‍රය පිළිබඳ වැඩමුළුව | බංගලා භාරකරු - වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2013-09-02 2013-09-05 | 14 |

| | | | | |
|---|---|---|---|---|
| 28 | ආහාර මේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ සම්මන්ත්‍රණය | බංගලා භාරකරු - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2013-09-24 | 16 |
| 29 | හෝටල් ගෘහ පාලනය පිළිබඳ විශේෂ මූලික මට්ටමේ පාඨමාලාව | ත්‍රිකුණාමලය නැගෙනහිර පළාත් සභාව සඳහා තෝරා ගන්නා ලද සහභාගීවූවන් සඳහා | 2013-09-16<br>2013-10-16<br>(මාස 1) | 30 |
| 30 | අනුරාධපුරය මහබුලන්කුලම මහා විද්‍යාලය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-09-05<br>2013-09-06<br>2013-09-10 | 60 |
| 31 | උත්සවයක් සඳහා කටයුතු කිරීමට ශිෂ්‍යයන් යෙදවීම | පොළොන්නරුව සුදු අරලිය හෝටලය | 2013-09-05 | 09 |
| 32 | ශිෂ්‍ය සුභසාධක සංගමය විසින් සංවිධානය කරනු ලදුව අනුරාධපුර මහා රෝහල විසින් පවත්වන ලද ලිංගිකව බෝවන රෝග පිළිබඳ සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-09-09 | 64 |
| 33 | අනුරාධපුරය වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-09-12 | 20 |
| 34 | අනුරාධපුර සොලීඩ් පාපන්දු සමාජය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-09-13 | 08 |
| 35 | අනුරාධපුර ඉංග්‍රීසි ඇකඩමිය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-09-18 | 20 |
| 36 | ශිෂ්‍ය සුභසාධක සංගමය විසින් සංවිධානය කරනු ලදුව අනුරාධපුර මහරෝහල විසින් පවත්වන ලද ප්‍රථමාධාර වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-09-18 | 37 |
| 37 | ලෝක සංචාරක දිනය වෙනුවෙන් උතුරුමැද පළාත් සභාව සමඟ සම්බන්ධ වී පවත්වන ලද ශ්‍රමදාන සහ රුක් රෝපණ වැඩසටහන | මල්වතුඔය බැංකුව | 2013-09-27 | 53 |

| | | | | |
|---|---|---|---|---|
| 38 | ආහාර මේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ සම්මන්ත්‍රණය | බංගලා භාරකරුවන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2013-10-10 | 20 |
| 39 | වෘත්තීය සූපශාස්ත්‍ර, ආහාර පාන කළමනාකරණය, ගෘහපාලනය සහ අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය, මෙහෙයුම් පිළිබඳ නේවාසික වැඩමුළුව | විල්පත්තු අභය භූමියේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බංගලා භාරකරුවන් | 2013-10-29<br>2013-10-30<br>2013-10-31 | 18 |
| 40 | අනුරාධපුර සහිරා විද්‍යාලය සඳහා පවත්වන ලද ආහාරමේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරුකරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-01 | 20 |
| 41 | අනුරාධපුර මහ විද්‍යාලය සඳහා පවත්වන ලද ආහාරමේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරුකරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-02<br>2013-10-03<br>2013-10-03 | 60 |
| 42 | අනුරාධපුරය IDM ආයතනය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-08 | 20 |
| 43 | අනුරාධපුර ගන්තිරියාගම ම.වි. සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-09<br>2013-10-22<br>2013-10-23 | 60 |
| 44 | අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර ම.වි. සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-11<br>2013-10-15<br>2013-10-17 | 60 |
| 45 | අනුරාධපුර නිවන්තකචෛතිය ම.ව. සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-24 | 20 |
| 46 | අනුරාධපුර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-25 | 10 |

| | | | | |
|---|---|---|---|---|
| 47 | පලාඩිකුගම ජාතික යොවුන් සේනාංකය සඳහා පවත්වන ලද ආහාර මේස ආචාර ධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ හුරු කරවීමේ වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-29<br>2013-10-30<br>2013-10-31 | 60 |
| 48 | තිසාවැව හමුදා සේවා බළකා නිලධාරීන් සඳහා පවත්වන ලද ප්‍රායෝගික දිවා ආහාර වැඩසටහන | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, අනුරාධපුරය | 2013-10-29<br>2013-10-30<br>2013-10-31 | 60 |
| 49 | අනුරාධපුර උතුරු මැද පළාත් සභාව සඳහා පවත්වන ලද සංචාරක ප්‍රදේශ චාරිකා මහපෙන්වීම පිළිබඳ වැඩසටහන | උතුරු මැද පළාත් ශ්‍රවණාගාරය | 2013-11-30<br>2013-12-22 | 40 |

<u>රත්නපුර හෝටල් පාසැල</u>

| අංකය | වැඩසටහන | සංවිධානය | කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන සජීවී ප්‍රායෝගික ප්‍රදර්ශනාත්මක සැසිය | "කැගලු මේලා" | 2013-04-03<br>2013-04-06 | 63 |
| 02 | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පාඨමාලා පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන | "රත්නපුර මේලා" | 2013-04-04<br>2013-04-05 | 45 |
| 03 | ආහාරමේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ පුහුණු වැඩසටහන | සබරගමුව විශ්වවිද්‍යාලය | දින 04 | 30 |
| 04 | ආහාරමේස ආචාරධර්ම සහ සිරිත් විරිත් පිළිබඳ පුහුණු වැඩසටහන | ෆෙද විදුහල, රත්නපුර | දින 05 | 219 |
| 05 | ගෘහ සේවය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව | සබරගමුව විශ්වවිද්‍යාලය | දින 04 | 30 |
| 06 | ගෘහ සේවය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව | සබරගමුව විශ්වවිද්‍යාලය | 2013-10-29 | 15 |
| 07 | ගෘහ සේවය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව | සබරගමුව විශ්වවිද්‍යාලය | 2013-10-30 | 15 |
| 08 | පාසැල් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන, සජීවී ප්‍රායෝගික ප්‍රදර්ශනාත්මක සැසිය | ගෘහ විද්‍යා ගුරුවරුන් / රත්නපුර පාසැල් | 2013-11-05 | 200 |

# 2013 වර්ෂයේ පවත්වන ලද විෂය බාහිර ක්‍රියාකාරකම්

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - කොළඹ



සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීම - අලුත් අවුරුදු උත්සවය 2013 අප්‍රේල් 25



වෙසක් පහන් කූඩු තරඟය




වෙසක් බැති ගී






වෙසක් දන්සැල




කලා උළෙල- 2013

- ලෝක සංචාරක දිනය සැමරීම - 2013 සැප්තැම්බර් 27
    - ආපනශාලාව පිරිසිදු කිරීම සහ පිළිවෙලකට සකස් කිරීම
    - පෝස්ටර් තරඟය
    - දැනුවත් කිරීමේ වැඩසටහන
    - ශිෂ්‍යයින්ගේ විවාදය

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - මහනුවර







බක්මහා උළෙල - 2013 අප්‍රේල් 25










"සව්" දන්සල - 2013 මැයි 24

- කටුමැටි කුටි ව්‍යාපෘතිය





මුල්ගල තැබීම

ගෙවැදීමේ උත්සවය

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - බණ්ඩාරවෙල



හෝටල් සංචාරය

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - අනුරාධපුර





ලෝක සංචාරක දිනය සැමරීම

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - රත්නපුර



අලුත් අවුරුද්ද සැමරීම





අන්තර් ක්‍රිකට් තරඟාවලිය

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - කොග්ගල



ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



රැකියා වෙළඳ පොළ







පරිශ්‍රයේදී පැවැත් වූ බණ පිංකම

## 2013 වර්ෂයේදී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංකය | දිනය |
|---|---|
| 46 | 2013 ජනවාරි 24 |
| 47 | 2013 මාර්තු 28 |
| 48 | 2013 මැයි 28 |
| 49 | 2013 ජුලි 24 |
| 50 | 2013 සැප්තැම්බර් 12 |
| 51 | 2013 ඔක්තෝබර් 28 |
| 52 | 2013 දෙසැම්බර් 09 |

## 2013 වර්ෂයේදී පවත්වන ලද<br>විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව

| විගණන හා කළමනාකරණ රැස්වීම් අංකය | දිනය |
|---|---|
| 01 | 2013 ජනවාරි 31 |
| 02 | 2013 මාර්තු 14 |
| 03 | 2013 ජුනි 13 |
| 04 | 2013 සැප්තැම්බර් 30 |
| 05 | 2013 දෙසැම්බර් 13 |

# අනුමත අයවැය - 2013 වර්ෂය

## (අ) පුනරාවර්තන අයවැය

රු. මිලියන

| කේතය | විස්තරය | කොළඹ රු. | මහනුවර රු. | අනුරාධපුර රු. | කොග්ගල රු. | බණ්ඩාරවෙල රු. | රත්නපුර රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම | | | | | | | |
| 401 | ආපනශාලාව හා බීමහලේ විකුණුම් | 16,000,000 | - | - | - | - | - | 16,000,000 |
| 531 | විකුණුම් පිරිවැය | 6,400,000 | - | - | - | - | - | 6,400,000 |
| | දළ ආදායම | 9,600,000 | - | - | - | - | - | 9,600,000 |
| 404 | කාමර විකුණුම් | 15,000,000 | - | - | - | - | - | 15,000,000 |
| 405 | බේකරි ආදායම | 2,000,000 | | | | | | |
| 406 | ලොන්ඩ්‍රි ආදායම | 2,000,000 | | | | | | |
| 407 | අවකාශ සහ ශ්‍රවනාගාර බදු කුලිය | 7,000,000 | - | - | - | - | - | 7,000,000 |
| 403 | විශේෂ වැඩසටහන් | 2,000,000 | 800,000 | 500,000 | 500,000 | 500,000 | 300,000 | 4,600,000 |
| 408 | පංතිකාමර බදු කුලිය | 2,000,000 | | | | | | |
| 409 | වෙනත් ආදායම් | 1,500,000 | 500,000 | 100,000 | 270,000 | 100,000 | 100,000 | 2,570,000 |
| 412 | සී.එච්.එස් ආදායම | 4,000,000 | 1,200,000 | 600,000 | 500,000 | 600,000 | 400,000 | 7,300,000 |
| 413 | පාසැල් ගාස්තු | 17,000,000 | 8,000,000 | 4,000,000 | 4,000,000 | 4,000,000 | 4,000,000 | 41,000,000 |
| 410C | මහපෙන්වීමේ දේශන වැඩසටහන් | 8,000,000 | 800,000 | 200,000 | 360,000 | 50,000 | 50,000 | 9,460,000 |
| 414 | වැට් + ජා.ගො. බ | 4,122,000 | 230,000 | 108,000 | 154,600 | 105,000 | 107,000 | 4,826,600 |
| | මුළු ආදායම | 74,222,000 | 11,530,000 | 5,508,000 | 5,784,600 | 5,355,000 | 4,957,000 | 101,356,600 |
| | අඩුකළා -වැට් + ජා.ගො. බ | 4,122,000 | 230,000 | 108,000 | 154,600 | 105,000 | 107,000 | 4,826,600 |
| | වැට් +ජා.ගො.බ. පසු ආදායම | 70,100,000 | 11,300,000 | 5,400,000 | 5,630,000 | 5,250,000 | 4,850,000 | 102,530,000 |
| | අඩුකළා : පරිපාලන සහ ආයතන වියදම් | 174,850,000 | 37,988,000 | 15,736,000 | 21,282,000 | 15,567,000 | 17,137,000 | 282,560,000 |
| 603 | ක්ෂය | (20,000,000) | (5,000,000) | (3,000,000) | (3,000,000) | (3,000,000) | (3,000,000) | (37,000,000) |
| | මෙහෙයුම් වල ශුද්ධ පිරිවැය | **(124,750,000)** | **(31,688,000)** | **(13,336,000)** | **(18,652,000)** | **(13,317,000)** | **(15,287,000)** | **(217,030,000)** |

| කේතය | විස්තරය | කොළඹ රු. | මහනුවර රු. | අනුරාධපුර රු. | කොග්ගල රු. | බණ්ඩාරවෙල රු. | රත්නපුර රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| **පරිපාලන සහ ආයතන වියදම්** | | | | | | | | |
| 501 | වැටුප් හා දීමනා | 35,000,000 | 10,000,000 | 4,000,000 | 5,000,000 | 4,000,000 | 4,000,000 | 62,000,000 |
| 501A | නිවාඩු දින දීමනා | 350,000 | 100,000 | 30,000 | 50,000 | 30,000 | 30,000 | 590,000 |
| 501B | කථිකාචාර්යවරුන් සඳහා දීමනා | 3,000,000 | 500,000 | 500,000 | 1,000,000 | 300,000 | 1,000,000 | 6,300,000 |
| 502 | අතිකාල | 1,175,000 | 100,000 | 50,000 | 75,000 | 50,000 | 100,000 | 1,550,000 |
| 503 | සේ.අ.අ | 5,250,000 | 1,500,000 | 600,000 | 750,000 | 600,000 | 600,000 | 9,300,000 |
| 503A | සේ.නි.භා.අ | 1,050,000 | 300,000 | 120,000 | 150,000 | 120,000 | 120,000 | 1,860,000 |
| 504 | කාර්ය මණ්ඩල සුභ සාධනය | 10,000,000 | 600,000 | 250,000 | 400,000 | 300,000 | 300,000 | 11,850,000 |
| 505 | කාර්ය මණ්ඩලය සඳහා ආහාර | 5,000,000 | 100,000 | 50,000 | 50,000 | 50,000 | 60,000 | 5,310,000 |
| 506 | දේශීය ගමන් | 300,000 | 200,000 | 62,000 | 100,000 | 100,000 | 100,000 | 862,000 |
| 507 | විදේශ ගමන් | 1,000,000 | - | - | - | | | **1,000,000** |
| 508 | සංග්‍රහ දේශීය | 300,000 | 50,000 | 12,000 | 20,000 | 20,000 | 30,000 | 432,000 |
| 510 | කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් | 750,000 | 75,000 | 20,000 | 20,000 | 20,000 | 20,000 | 905,000 |
| 511 | ශෝධන සැපයුම් | 1,200,000 | 250,000 | 50,000 | 50,000 | 50,000 | 50,000 | 1,650,000 |
| 512 | විවිධ සැපයුම් | 9,500,000 | 7,500,000 | 2,500,000 | 3,000,000 | 2,500,000 | 3,000,000 | 28,000,000 |
| 512A | දැයට කිරුළ | 3,000,000 | | | | | | 3,000,000 |
| 513 | ලිපිද්‍රව්‍ය | 4,000,000 | 200,000 | 200,000 | 200,000 | 100,000 | 150,000 | 4,850,000 |
| 513A | මුද්‍රණ සහ ප්‍රකාශන | 3,000,000 | 100,000 | 25,000 | 50,000 | 50,000 | 50,000 | 3,275,000 |
| 514 | දුරකථන හා විද්‍යුත් තැපැල | 3,500,000 | 1,000,000 | 250,000 | 500,000 | 500,000 | 200,000 | 5,950,000 |
| 515 | තැපැල,මුද්දර සහ විදුලි පණිවුඩ ගාස්තු | 300,000 | 50,000 | 35,000 | 75,000 | 50,000 | 50,000 | 560,000 |
| 518 | විදුලි බලය සහ ගෑස් | 20,000,000 | 2,000,000 | 600,000 | 2,000,000 | 800,000 | 1,000,000 | 26,400,000 |
| 519 | වරිපනම් සහ බලපත්‍ර | 1,500,000 | 50,000 | 20,000 | 5,000 | 5,000 | 5,000 | 1,585,000 |
| 520 | රක්ෂණ ස්ථාවර වත්කම් | 1,200,000 | - | - | - | - | - | 1,200,000 |
| 521 | ලොන්ඩ්‍රි වියදම් | 1,000,000 | 100,000 | 30,000 | 30,000 | 30,000 | 30,000 | 1,220,000 |
| 522 | නඩත්තු - ගොඩනැගිලි | 4,000,000 | 1,500,000 | 200,000 | 200,000 | 250,000 | 250,000 | 6,400,000 |
| 523 | නඩත්තු - උපකරණ | 5,000,000 | 1,000,000 | 300,000 | 500,000 | 300,000 | 300,000 | 7,400,000 |
| 524 | සාමාන්‍ය ප්‍රචාරණය | 5,000,000 | - | - | - | - | - | 5,000,000 |

| කේතය | විස්තරය | කොළඹ රු. | මහනුවර රු. | අනුරාධපුර රු. | කොග්ගල රු. | බණ්ඩාරවෙල රු. | රත්නපුර රු. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම | | | | | | | |
| 525 | ප්‍රවාහනය සහ ගැල් කුලිය | 50,000 | 50,000 | 25,000 | 50,000 | 50,000 | 25,000 | 250,000 |
| 526 | කාර්ය මණ්ඩල රක්ෂණය | 25,000 | - | - | - | - | - | 25,000 |
| 527 | බැංකු ගාස්තු | 50,000 | 3,000 | 2,000 | 2,000 | 2,000 | 2,000 | 61,000 |
| 528 | නෛතික ගාස්තු සහ විගණන ගාස්තු | 200,000 | - | - | - | - | - | 200,000 |
| 530 | වාහන නඩත්තු සහ අළුත්වැඩියා | 2,000,000 | 500,000 | 350,000 | 350,000 | 350,000 | 350,000 | 3,900,000 |
| 530A | වාහන කුලියට ගැනීම | 5,000,000 | 1,500,000 | 1,000,000 | 1,200,000 | 1,200,000 | 1,200,000 | 11,100,000 |
| 530B | පෙට්‍රල් සහ තෙල් | 4,000,000 | 400,000 | 300,000 | 300,000 | 300,000 | 300,000 | 5,600,000 |
| 533 | අමු ද්‍රව්‍ය ශිෂ්‍යයින්ට | 19,000,000 | 5,000,000 | 2,000,000 | 2,300,000 | 2,000,000 | 2,300,000 | 32,600,000 |
| 535 | බාහිර කථිකාචාර්ය ගාස්තු | 4,000,000 | 1,500,000 | 1,500,000 | 2,000,000 | 1,000,000 | 1,000,000 | 11,000,000 |
| 537 | මෙනුස් ෆලවර්ස් | 200,000 | 35,000 | 5,000 | 5,000 | 5,000 | 5,000 | 255,000 |
| 538 | ශිෂ්‍ය වැඩසටහන් | 3,000,000 | 20,000 | 20,000 | 20,000 | 20,000 | 20,000 | 3,100,000 |
| 539 | මඟපෙන්වීම් දේශන වැඩසටහන් | 6,000,000 | 500,000 | 150,000 | 275,000 | 35,000 | 35,000 | 6,995,000 |
| 554 | මණ්ඩල සාමාජික දීමනා | 400,000 | - | - | - | - | - | 400,000 |
| 593 | කාර්ය මණ්ඩල පුහුණු | 1,200,000 | 100,000 | 20,000 | 20,000 | 20,000 | 20,000 | 1,380,000 |
| 601 | පොත්පත් හා වාරසඟරා | 1,000,000 | 75,000 | 50,000 | 25,000 | 50,000 | 25,000 | 1,225,000 |
| 610 | පැමිණීමේ දිරි දීමනා | 1,500,000 | 500,000 | 200,000 | 300,000 | 200,000 | 300,000 | 3,000,000 |
| 612 | ජලය | 1,250,000 | 500,000 | 200,000 | 200,000 | 100,000 | 100,000 | 2,350,000 |
| 613 | දත්ත සැකසුම | 600,000 | 30,000 | 10,000 | 10,000 | 10,000 | 10,000 | 670,000 |
| | මුළු පිරිවැය | 174,850,000 | 37,988,000 | 15,736,000 | 21,282,000 | 15,567,000 | 17,137,000 | 282,560,000 |

## (ආ) ප්‍රාග්ධන අයවැය

රු. මිල

| අයිතමය | කොළඹ | මහනුවර | අනුරාධපුර | කොග්ගල | බණ්ඩාරවෙල | රත්නපුර | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ | 5,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 | 10,000,000 |
| උපකරණ | 15,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 | 20,000,000 |
| වීදුරු භාණ්ඩ පිඟන් කෝප්ප | 2,000,000 | 1,000,000 | 600,000 | 100,000 | 100,000 | 100,000 | 3,900,000 |
| හැඳිගැරුප්පු සහ රිදී භාණ්ඩ | 2,000,000 | 1,000,000 | 800,000 | 100,000 | 100,000 | 100,000 | 4,100,000 |
| රෙදි පිළි | 2,000,000 | 1,000,000 | 700,000 | 800,000 | 700,000 | 1,000,000 | 6,200,000 |
| අළුත්වැඩියා | 10,000,000 | | | 1,000,000 | | | 11,000,000 |
| දත්ත සැකසුම් | 3,000,000 | 500,000 | 600,000 | 1,000,000 | 500,000 | 500,000 | 6,100,000 |
| ආරක්ෂණ සහ ගිනි රැකවරණ | 2,000,000 | | | | | | 2,000,000 |
| | **41,000,000** | **5,500,000** | **4,700,000** | **5,000,000** | **3,400,000** | **3,700,000** | **63,300,000** |

(ඇ)

## පුනරාවර්තන සහ ප්‍රාග්ධන අයවැය

| ආයතන | කොළඹ | මහනුවර | අනුරාධපුර | කොග්ගල | බණ්ඩාරවෙල | රත්නපුර | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 124,750,000 | 31,688,000 | 13,336,000 | 18,652,000 | 13,317,000 | 15,287,000 | 217,030,000 |
| ප්‍රාග්ධන | 41,000,000 | 5,500,000 | 4,700,000 | 5,000,000 | 3,400,000 | 3,700,000 | 63,300,000 |
| එකතුව | 165,750,000 | 37,188,000 | 18,036,000 | 23,652,000 | 16,717,000 | 18,987,000 | 280,330,000 |

## (ඇ) අරමුදල් ප්‍රභව

| ආයතන | එකතුව | **SLTDA** | **SLTPB** | **SLITHM** | **SLCB** |
|---|---|---|---|---|---|
| සංචාරක සංවර්ධන ගාස්තු | 863,590,000 | 120,900,000 | 604,520,000 | 103,630,000 | 34,540,000 |
| නැව් ගාස්තු | 1,472,510,000 | 206,160,000 | 1,030,750,000 | 176,700,000 | 58,900,000 |
| එකතුව | **2,336,100,000** | **327,060,000** | **1,635,270,000** | **280,330,000** | **93,440,000** |

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ප්‍රමාණය/රු.

| වත්කම් | Note | 2013 | 2012 |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 03 | 3,905,480.21 | 1,963,578.97 |
| වෙළඳ ණයගැතියෝ | 04 | 15,003,291.03 | 14,581,666.42 |
| තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු | 05 | 3,297,313.93 | 3,737,313.93 |
| ශ්‍රී.ලං.සං.සං.අ.සහ ශ්‍රී.ලං.ස.කා.ලැබිය යුතු | 06 | 127,990,710.49 | 56,380,838.51 |
| ණය සහ වෙනත් දෑ | 07 | 8,153,774.08 | 8,063,816.66 |
| අත්තිකාරම් | 08 | 464,455.72 | 449,851.00 |
| පූර්ව ගෙවීම් | 09 | 558,296.02 | 7,062,769.29 |
| පාරිතෝෂික ආයෝජනය | | 12,043,528.06 | - |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 10 | 26,661,696.98 | 134,916,047.90 |
| **මුළු ජංගම වත්කම්** | | 198,078,546.52 | 227,155,882.68 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත සහ උපකරණ | 02 | 620,349,212.61 | 572,308,458.33 |
| අඩුකළා:ක්ෂය සඳහා ප්‍රතිපාදන | | 204,977,193.53 | 170,084,601.32 |
| **ලියාහල අගය** | | **415,372,019.08** | **402,223,857.01** |
| එකතු කළා: කෙරීගෙන යන වැඩ | | 4,815,644.75 | 22,465,177.65 |
| ආයෝජන | | 102,858,301.31 | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 523,045,965.14 | 424,689,034.66 |
| **මුළු වත්කම්** | | **721,124,511.66** | **651,844,917.34** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු/අනෙකුත් ගෙවිය යුතු | 11 | 2,112,041.59 | 2,526,810.73 |
| ශ්‍රී.ලං.සං.සං.අ.සහ ශ්‍රී.ලං.ස.කා.ලැබිය | 12 | 8,297,267.62 | 6,657,304.26 |

| | | | |
|---|---|---|---|
| උපචිත වියදම් | 13 | 13,677,962.71 | 25,355,370.75 |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 14 | 13,220,220.00 | 11,910,882.00 |
| **මුළු ජංගම වගකීම්** | | 37,307,491.92 | 46,450,367.74 |
| **ශුද්ධ වත්කම්** | | **683,817,019.74** | **605,394,549.60** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| ප්‍රාග්ධන දායකත්වය | | 454,850,951.89 | 454,850,951.89 |
| ආදායම් ගිණුම | | 215,196,789.25 | 136,774,319.11 |
| JABIC සහ UNDP ප්‍රධාන | | 13,769,278.60 | 13,769,278.60 |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | **683,817,019.74** | **605,394,549.60** |

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ප්‍රමාණය /රු.

| | Note | 2013 | 2012 |
|---|---|---|---|
| ආදායම | | | |
| සංචාරක සංවර්ධන ගාස්තු | | 100,509,687.92 | 90,658,240.27 |
| නැව් නැගීම් ගාස්තු | | 192,313,191.78 | 139,402,278.85 |
| පාසැල් ගාස්තු සහ අනෙකුත් දෑ | | 37,551,250.67 | 40,546,566.75 |
| වෙනත් ආදායම් | | 4,185,923.81 | 3,194,240.48 |
| හෝටල් ආදායම් | | 21,569,647.31 | 15,567,669.63 |
| මුළු ආදායම | | **356,129,701.49** | **289,368,995.98** |
| වියදම් | | | |
| වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | | 106,437,864.53 | 85,151,942.97 |
| සැපයුම් සහ උපයෝජන භාවිත | | 134,123,231.61 | 120,182,913.92 |
| ක්ෂය සහ ක්‍රම ක්ෂය වියදම් | | 34,892,592.20 | 32,530,065.75 |
| වෙනත් වියදම් | | 2,111,058.07 | 530,000.00 |
| මූල්‍ය පිරිවැය | | 311,193.13 | 77,896.38 |
| මුළු පිරිවැය | | **277,875,939.54** | **238,472,819.02** |
| අතිරික්තය/(හිඟය) | | **78,253,761.95** | **50,896,176.96** |

සත්කාරයේ විශිෂ්ටත්වය

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | 2013 | 2012 |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය | 78,422,470.14 | 53,580,402.43 |
| **මූල්‍ය නොවන සංචලන** | | |
| ක්ෂයවීම් | 34,892,592.20 | 32,530,065.75 |
| පාඩු/කපා හැරීම් | - | (772,218.70) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 1,528,218.00 | 1,422,227.00 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය | 114,843,280.34 | 86,760,476.48 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | |
| භාණ්ඩතොග (වැඩිවීම)/අඩුවීම | (1,941,901.24) | (259,839.04) |
| වෙළඳ ණයගැතියෝ(වැඩිවීම)/අඩුවීම | (421,624.61) | (2,066,156.01) |
| තැන්පතු සහ වෙනත් ලැබිය යුතු (වැඩිවීම)/අඩුවීම | 440,000.00 | |
| ශ්‍රී.ලං.සං.සං.අ.සහ ශ්‍රී.ලං.ස.කා. (වැඩිවීම)/අඩුවීම | | (440,000.00) |
| | (71,609,871.98) | (10,282,119.64) |
| පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 6,504,473.27 | (6,953,129.82) |
| ණය සහ අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | (104,562.14) | 524,782.46 |
| ගෙවිය යුතු තැන්පතු(වැඩිවීම)/අඩුවීම | (414,769.14) | 911,438.84 |
| අනෙකුත් ගෙවීම්(වැඩිවීම)/අඩුවීම | 1,639,963.36 | 2,723,062.07 |
| උපචිත වියදම් | (11,677,408.04) | 11,567,369.00 |
| | (77,585,700.52) | (4,274,592.14) |
| **මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **37,257,579.82** | **82,485,884.34** |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | |
| පාරිතෝෂික ගෙවීම් | (218,880.00) | (425,272.50) |
| දේපල,පිරියත,උපකරණ මිලදී ගැනීම | (30,391,221.38) | (47,046,598.29) |
| පාරිතෝෂික සහ අතිරික්ත මුදල් වල ආයෝජනය | (114,901,829.37) | |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(145,511,930.75)** | **(47,471,870.79)** |
| **මුදල් සහ මුදල් සමාන වස්තු වල ශුද්ධ වැඩිවීම්** | **(108,254,350.93)** | **35,014,013.55** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන වස්තු** | **134,916,047.91** | **99,902,034.36** |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන වස්තු** | **26,661,696.98** | **134,916,047.91** |

# ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.
2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා.

ප්‍රමාණය /රු.

| | සටහන | දායක ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය / (හිගය) | එකතුව |
|---|---|---|---|---|
| | | | | |
| 2012 දෙසැම්බර් 31දිනට ශේෂය | | 454,850,951.89 | 139,458,544.58 | 594,309,496.47 |
| | | | | - |
| පූර්ව වර්ෂ ගැලපුම් | | | (2,684,225.47) | (2,684,225.47) |
| | | | | - |
| යලි දක්වන ලද ශේෂය | | 454,850,951.89 | 136,774,319.11 | 591,625,271.00 |
| | | | | - |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (හිගය) | | | 78,253,761.95 | 78,253,761.95 |
| | | | | |
| **2011 දෙසැම්බර් 31දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය** | | **454,850,951.89** | **215,028,081.06** | **669,879,032.95** |

**සටහන :- 01**

**තොග ශේෂය**

| **විස්තරය** | **2013** | **2012** |
|---|---|---|
| මත්පැන් තොග | 83,539.83 | 90,119.55 |
| ප්‍රධාන ගබඩාව | 3,653,232.19 | 1,873,459.42 |
| එකතුව | **3,736,772.02** | **1,963,578.97** |

**සටහන :- 02**

**වෙළඳ ණයගැතියෝ**

| **විස්තරය** | **2013** | **2012** |
|---|---|---|
| ඇක්සස් ටවර් | - | 40,063.03 |
| ඒ.ජී.එම් - ජී.සී හවුස් | 11,953.74 | - |
| වායා බිලූ හෝටලය | 29,970.00 | 29,970.00 |
| සී.එච්.එස්.ජී.ඒ | - | 55,392.81 |
| සිනමන් ලොජ් හබරණ | 105,838.46 | 105,838.46 |
| සිලෝන් කොන්ටිනන්ටල් හෝටලය | - | 49,501.24 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලය | - | 100,953.11 |
| ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුව | 19,812.00 | 239,306.40 |

| | | |
|---|---|---|
| ඩී.එක්ස්.එන්.ලංකා | 17,000.00 | 17,000.00 |
| සී.ස.ෆී ලංකා ට්‍රේඩින් සමාගම | 18,000.25 | 18,000.25 |
| සී.ස.අයි.එම්.එස්.එස්.පුද්ගලික සමාගම | 34,834.80 | 34,834.80 |
| නර්තන හා කථන ආයතනය | 12,870.00 | 12,870.00 |
| යාපනය ජාත්‍යාන්තර වෙළඳපොළ | - | 61,150.00 |
| කීල්ස් හෝටල් කළමනාකරණය | 211,259.97 | 71,488.00 |
| සී.ස.මෙල්වයර් රෝලින් සමාගම | 2,833.60 | 2,833.60 |
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | - | 142,749.89 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 4,873,143.51 | 4,956,600.52 |
| සී.ස.මොබිටෙල් පුද්ගලික සමාගම | - | 328,692.71 |
| දුලාර මහතා - ලංකා වාණිජ මණ්ඩලය | 62,262.21 | 62,262.21 |
| අනුර පෙරේරා මහතා | 46,752.59 | 46,752.59 |
| නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා | 1,118,000.00 | - |
| චින්තක කුලතිලක මහතා | 13,199.95 | - |
| කොන්ඩ්‍රඩ් මහතා- වායා සිටිඩෙල් | 2,500.00 | 2,500.00 |
| දනන්ජය නන්දසිරි මහතා | - | 32,000.00 |
| දීපාල් ගමගේ - අම්බලන්ගොඩ | 8,000.00 | 8,000.00 |
| ෆැන්කෝ මහතා | 19,712.00 | 19,712.00 |
| ජෝර්ජ් ද සිම්ප්කින් - රග්බි උපදේශක | 295,800.00 | - |
| හන්ට් මහතා | 2,587.20 | 2,587.20 |
| ජේ.ඩී.ජයසේකර මහතා - මහනුවර | 9,856.00 | 9,856.00 |
| ජයන්ත එදිරිසිංහ මහතා | 198,359.39 | - |
| කීර්ති මහතා - වායා විලේජ් | 9,856.00 | 9,856.00 |
| මවුසූර් ඉස්මින්ක් මහතා | 32,000.00 | - |
| එන්.වයි. අබේවර්ධන | - | 79,148.00 |
| ක්‍යූ ශැන්ග් මහතා | 19,712.00 | 19,712.00 |
| රංග ගයාන් මහතා | - | 70,348.00 |
| සේගා නගේන්ද්‍ර මහතා | 59,052.69 | - |
| ටවාන් මහතා | 9,856.00 | - |
| විනෝද් ක්‍රිශ්ණා | 9,856.00 | - |
| යොහාන් පීරිස් මහතා - ජෝන් කීල්ස් | 86,925.06 | - |
| ඈන් ඉබ්‍රෙල්ටා මිය | 78,848.00 | - |
| භාලියා ගලාලි මිය (කොළඹ සංගීත උත්සවය) | 312,253.89 | 312,253.89 |
| ඔයාමා කුන්ජු මිය | 3,449.60 | - |
| වන් ස්ටොප් යුනිට් | 409,504.84 | 542,505.27 |
| සී.ස.PCH හෝල්ඩින් පුද්ගලික සමාගම | - | 42,200.83 |
| සී.ස.රේන්බෝ රිසෝසස් පුද්ගලික සමාගම | 113,400.08 | - |
| එස්.එල්.ටී.සී.බී. | 53,559.44 | 14,498.55 |
| එස්.එල්.ටී.ඩී.ඒ | 1,912,165.06 | 933,709.61 |
| එස්.එල්.ටී.ඩී.ඒ ( ව්‍යාපෘති සංවර්ධන සහ වැඩසටහන්) | 176,941.86 | - |
| එස්.එල්.ටී.ඩී.ඒ (S & QA ) | 262,088.99 | - |
| එස්.එල්.ටී.පී.බී | 2,960,341.83 | 4,417,949.42 |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉකෝ පදනම | 4,500.24 | 21,000.48 |
| ශ්‍රී ලංකා ගුවන් සේවා,බ.අ.ගු. කටුනායක | 23,900.00 | 23,900.00 |
| සුම්මා ට්‍රැවල්ස් | - | 13,312.79 |
| තැපැල්පති | - | 167,001.76 |
| TRIP ව්‍යාපෘතිය | 1,350,533.78 | 1,386,777.74 |
| බස්නාහිර පළාත් සංචාරක ව්‍යාපෘතිය | - | 76,577.26 |
| **මුළු එකතුව** | **15,003,291.03** | **14,581,666.42** |

සටහන **:- 03**

**තැන්පතු ලැබියයුතු**

| **ක්ෂයවීම්** | **2013** | **2012** |
|---|---|---|
| සී.එෆ්.ද මෙල්, ඉන්ධන සඳහා තැන්පතු | 100,000.00 | 100,000.00 |
| ඇප තැන්පතු | 1,617,500.00 | 1,617,500.00 |
| බ.අ. ස.ශා - 2009 උපාධි ප්‍රදානෝත්සවය | 76,812.35 | 76,812.35 |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව (දැනුමැති සමාජ ව්‍යාපෘතිය) | - | 440,000.00 |
| **එකතුව** | **1,794,312.35** | **2,234,312.35** |

**අනෙකුත් ලැබිය යුතු**

| **ක්ෂය** | **2013** | **2012** |
|---|---|---|
| සංචාරක සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 1,503,001.58 | 1,503,001.58 |
| **එකතුව** | **1,503,001.58** | **1,503,001.58** |
| | | |
| **මුළු එකතුව** | **3,297,313.93** | **3,737,313.93** |

සටහන **:- 04**

**ලැබියයුතු - ශ්‍රී.ලං.සං.සං.අං**

| **ක්ෂයවීම්** | **2013** | **2012** |
|---|---|---|
| ආපදා ණය | 54,400.00 | 54,400.00 |
| උපචිත වියදම් - 2007 | 3,810,323.65 | 3,810,323.65 |
| ආපදා ණය - එන්.ටී.එන්.සමරසිංහ මහතා | 168,445.00 | 168,445.00 |
| ආපදා ණය - ඩබ්.එම්.සිරිපාල මහතා | 184,320.00 | 184,320.00 |
| ආපදා ණය - කේ.ගනේෂ් මහතා | 161,520.00 | 161,520.00 |
| ආපදා ණය -එම්.ආර්.ජ්.එස්.පීරිස් මහතා | 104,890.00 | 104,890.00 |
| එස්.සමරවීර මහතා- සැප් 2010- දෙසැ 2011 | 349,442.58 | 349,442.58 |
| සභාපති බී ගුණතිලක - කොරියා සංචාරය | 237,575.98 | 237,575.98 |
| සංචාරක සංවර්ධන ගාස්තු | 37,335,366.20 | 22,073,059.09 |
| නැව් නැගීම් ගාස්තු. | 85,214,081.32 | 34,034,844.46 |
| සේ.අ.අ 2008 ජුනි | 22,038.75 | 22,038.75 |
| කාර්ය මණ්ඩල නඩත්තුව සඳහා අතිකාල 2012/2013 | 303,822.73 | 136,483.07 |
| **එකතුව** | **127,946,226.21** | **61,337,342.58** |

ලැබියයුතු ශ්‍රී.ලං.සං.ප්‍ර.කා - 126 k

| විස්තරය | 2013 | 2012 |
|---|---|---|
| ඒ.ඕවිටිපාන මිය - වැටුප් 2010 සැප් - 2011 දෙසැ | 44,484.28 | 44,484.28 |
| එකතුව | **44,484.28** | **44,484.28** |

| | | |
|---|---|---|
| එකතුව | **127,990,710.49** | **61,381,826.86** |

සටහන :- 05

ණය හා අනෙකුත් දැ

| | 2013 | 2012 |
|---|---|---|
| ආපදා ණය | 7,937,259.08 | 7,888,146.66 |
| විශේෂ ණය | 112,515.00 | 106,670.00 |
| උත්සව අත්තිකාරම් | 104,000.00 | 69,000.00 |
| | **8,153,774.08** | **8,063,816.66** |

සටහන :- 06

හිඟහිටි අත්තිකාරම්

සාමාන්‍ය

| අත්තිකාරම් අංකය | නම | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 75 | පී.එස්.කුලතුංග | කුලරය අළුත්වැඩියා කිරිම. | 59,604.72 |
| එකතුව | | | **59,604.72** |

විදේශ

| අත්තිකාරම් අංකය | නම | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 25 | සී.එල්.පෙරේරා | මැලේසියා සංචාරය සඳහා අනියම් වියදම් | 47,845.60 |
| 26 | සී.එල්.පෙරේරා | ඉහත සංචාරය සඳහා නවාතැන් සහ ආහාර ගාස්තු | 357,005.40 |
| එකතුව | | | **404,851.00** |
| | | | |
| | එකතුව | | **464,455.72** |

සටහන : 07

**පූර්ව ගෙවීම්**

| නම | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| අනුරාධපුර | | |
| යුනිවෝකස් පුද්ගලික සමාගම | ආදායම් පහසුකම් සඳහා සේවා ගාස්තු - 06/2013-05/2014 | 5,833.33 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | සේවා ගාස්තු ගෙවීම - 220 | 12,104.15 |
| Total | | 17,937.48 |

| | | |
|---|---|---|
| බණ්ඩාරවෙල | | |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | ඩිජිටල් ඩුප්ලිකේටරය (S.N.XL301008013C) සහ ඡායා පිටපත් යන්ත්‍රය (S/n. EQV 05919)- 2013/04-2014/03 | 8,000.00 |
| එකතුව | | 8,000.00 |

| | | |
|---|---|---|
| කොළඹ | | |
| බ්‍රිතාන්‍ය කවුන්සිලය | බ්‍රිටිෂ් කවුන්සිලයේ සාමාජිකත්වය අලුත් කිරීම | 2,333.34 |
| එමිට් ඉන්ටර්නැෂනල් පුද්.සමාගම | ටයිම් සඟරාව සඳහා සාමාජිකත්වය අලුත් කිරීම | 2,447.00 |
| බ්‍රිටිෂ් කවුන්සිලය | (2013 -2014) වර්ෂ සඳහා සාමාජිකත්වය අලුත් කිරීම | 250.00 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | ඡායා පිටපත් යන්ත්‍රය සඳහා වන සේවා ගිවිසුම සඳහා ගෙවීම් සිදු කිරීම | 11,666.67 |
| මෙට්‍රොපොලිටන් කොමියුනිකේෂන් පුද්ගලික සමාගම | දුරකථන පද්ධතිය සඳහා නඩත්තු ගිවිසුම | 53,452.70 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම | අංක GH 3129 දරන වාහනය රක්ෂණය කිරීම 25.06.14 -26.06.13) | 10,706.68 |
| ඔෆිස් නෙට්වර්ක් පුද්ගලික සමාගම | මානව සම්පත් කාර්යාලයේ තිබෙන ෆැක්ස් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම | 2,403.33 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම | රක්ෂණ ආවරණය අලුත් කිරීම සඳහා ගෙවීම - 24.07.14 -25.07.13 | 23,237.38 |
| එසන්ස් පබ්ලිෂර්ස් | ශ්‍රී.ලං.සං.හා.හෝ.ක.ආ. පුස්තකාලය සඳහා Management Digest සඟරාව අලුත් කිරීම | 2,216.67 |
| ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් සමාගම | ඩිජිටල් කොපි ප්‍රින්ටරය සඳහා වන නඩත්තු ගිවිසුම සඳහා ගෙවීම | 7,250.00 |
| ඉන්ටර්නැෂනල් බුක් හවුස් | නැෂනල් ජෝග්‍රොෆික් සහ රීඩර්ස් ඩයිජස්ට් සඟරා දායකත්වය අලුත් කිරීම | 10,146.43 |
| ඉන්ටර්නැෂනල් බුක් හවුස් | ඉකොනොමිට්ස් සහ රීඩර්ස් ඩයිජස්ට් සඟරා දායකත්වය අලුත් කිරීම. | 31,624.14 |
| ඉන්ටර්නැෂනල් බුක් හවුස් | නැෂනල් ජෝග්‍රොෆික් සඟරාවේ දායකත්වය අලුත් කිරීම | 8,702.68 |
| එමිට් ඉන්ටර්නැෂනල් පුද්.සමාගම | ෆෝචූන් සඟරාවේ දායකත්වය අලුත් කිරීම - 09/2013-09/2014 | 5,156.25 |
| එකතුව | | 171,593.27 |

| මහනුවර | | |
|---|---|---|
| බ්‍රවුන් සහ සමාගම | Fo 5011 FO P 600 දරන ශාප් ෆැක්ස් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම | 458.33 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | ෆැක්ස් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම ( 2013/04/01-2014/03/31) | 1,375.00 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | ඩුප්ලිකේට් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම ( J3009110020)-2013/07-2014/06 | 9,000.00 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | ඡායා පිටපත් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම S.No.17387- 2013/09/01-2014/08/31 | 10,000.00 |
| සී.ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම | ගිණි රක්ෂණ වාරික 15/09/2013-14/09/2014 | 218,112.88 |
| එකතුව | | 238,946.21 |

| කොග්ගල | | |
|---|---|---|
| බ්‍රවුන් සහ සමාගම | වායු සමීකරණ 02 සඳහා සේවා ගිවිසුම - 2013.03.01-2014.02.31) | 4,000.00 |
| සිලෝන් වෙයිනික් මැෂින් ලිමිටඩ් | කිරුම් තරාදි සඳහා වන නඩත්තු ගිවිසුම සඳහා ගෙවීම. | 1,633.33 |
| සී.ස.හිඩෙකි ඉන්ටර්නැෂනල් සමාගම | S.No. N9291070054 දරන ඩුප්ලිකේට් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම අලුත් කිරීම | 6,833.34 |
| සී.ස. ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්. සමාගම | ඡායා පිටපත් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම අලුත් කිරීම | 9,895.84 |
| සී.ස. යුනිවෝකස් පුද්. සමාගම | ෆැක්ස් යන්ත්‍රය සඳහා ගෙවීම | 2,500.00 |
| සී.ස. ක්‍රාෆ්ට් ලංකා ඉන්ජිනියරින් පුද්/සමාගම | සේවා අලුත් කිරීම සඳහා ගෙවීම | 46,200.00 |
| එකතුව | | 71,062.51 |

| රත්නපුර | | |
|---|---|---|
| සී.ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම | ගිණි රක්ෂණ ආවරණය අලුත් කිරීම | 17,286.17 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | 5300 AB DCP ඩුප්ලෝ යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම | 3,000.00 |
| මෙට්‍රොපොලිටන් කාර්යාල පුද්ගලික සමාගම | කැනන් IR 2318 L ඡායා පිටපත් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම | 2,100.00 |
| සී.ස.ඔෆිස් නෙට්වර්ක් පුද්/සමාගම | බොදර් ෆැක්ස් යන්ත්‍ර සේවා සඳහා ගෙවීම | 4,257.48 |
| සී.ස. හෙමන්ස් ඉන්ටර්නැෂනල්පුද්.සමාගම | දුරකථන පද්ධතිය සඳහා සේවා ගිවිසුම | 24,112.90 |
| එකතුව | | 50,756.55 |

සටහන :- 08

**2013 දෙසැම්බර් 31 දිනට මුදල් සහ බැංකු ශේෂය**

| බැංකුව හා ශාඛාව | ගිණුම් අංකය | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | මුදල් ශේෂය | බැංකු ශේෂය | මුදල් ශේෂය | බැංකු ශේෂය |
| ලංකා බැංකුව - අනුරාධපුරය | 7120455 | 2,408,805.96 | 2,722,750.73 | 3,785,825.79 | 3,046,674.96 |
| ලංකා බැංකුව - බණ්ඩාරවෙල | 7120413 | 2,653,589.56 | 2,763,590.21 | 3,424,051.34 | 3,176,710.93 |
| ලංකා බැංකුව - කොළඹ | 7120156 | 18,301,386.05 | 24,508,165.82 | 121,130,308.34 | 134,301,641.89 |
| ලංකා බැංකුව - මහනුවර | 7120392 | 124,651.36 | 1,343,013.32 | 2,031,812.18 | 2,195,327.47 |
| ලංකා බැංකුව - කොග්ගල | 7120471 | 434,254.97 | 1,113,776.24 | 2,356,850.79 | 57,919.14 |
| ලංකා බැංකුව - රත්නපුර | 71114301 | 2,739,009.08 | 3,241,140.88 | 2,187,199.46 | 1,663,773.84 |
| | | **26,661,696.98** | **35,692,437.20** | **134,916,047.90** | **144,442,048.23** |

සටහන :- 09

**තැන්පතු සහ අනෙකුත් ගෙවියයුතු**

| **ක්ෂයවීම්** | **2013** | **2012** |
|---|---|---|
| ගෙවියයුතු තැන්පත් | 200,000.00 | 173,317.00 |
| කැඩී බිඳී යෑම් | 138,057.26 | 77,857.96 |
| ආට් ගෝල්ඩ් ප්‍රොජෙක්ට් | - | 260,495.00 |
| EKSP වැඩසටහන | 228,564.89 | - |
| ගෙවියයුතු මුද්දර බදු | 5,775.00 | 5,450.00 |
| වැට් - ගෙවියයුතු | 691,766.46 | 1,075,704.89 |
| ජා.ගො.බ - ගෙවිය යුතු | 146,960.04 | 148,361.66 |
| සේවක අර්ථසාධක අරමුදල | 688,500.81 | 701,450.20 |
| සේවා නියුක්තිකයන් භාර අරමුදල | 82,076.13 | 84,174.02 |
| උපයන ගෙවීම් බද්ද | (69,659.00) | |
| **එකතුව** | **2,112,041.59** | **2,526,810.73** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. TM2/K/SLITHM/1/13/18 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதි / Date 2014 ඔක්තෝබර් 07 දි

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.

**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2014 මැයි 23 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී . ල.රා. අ.ගි.ප්‍ර)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | යොමුව | අනුකූල නොවීම | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) i | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01-70 ඡේදය | ජංගම සහ ජංගම නොවන වත්කම් | කෙටි කාලීන ආයෝජන රු.මිලියන 100 ක ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කමක් ලෙස ඇතුළත් කර තිබුණි. |
| ii | 88 ඡේදය | අස්පෘශ්‍ය වත්කම් (intangible Assets) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ යන ස්පෘශ්‍ය වත්කම් යටතේ රු.736,505 ක වටිනාකම ඇති මෘදුකාංග පිරිවැයද ඇතුළත් කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 - 15 ඡේදය | තොග | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති තොග වටිනාකම ගණනය කල ආකාරය හෙළිදරව් කර නොතිබුණි. |

## 2.2.2 අසම්භාව්‍ය බැරකම්

ආයතනයේ සේවය කල හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් නොගෙවීම පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින බේරුම්කරණයෙන් උද්ගත විය හැකි බැරකම සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා හෝ හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

## 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල සහ පහත සඳහන් ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. දීර්ඝ කාලයක් තිස්සේ පවතින මෙම වෙනස්කම් සැසඳුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපයෝගී මූල්‍ය වාර්තාවල විස්තරය | උපයෝගී මූල්‍ය වාර්තා අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ශේෂ | 130,706,926 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම | 6,511,960 | 50,151,254 |
| | | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල | 174,346,220 | |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය | 8,297,267 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම | 11,236,982 | 2,939,715 |

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය වූ රු.15,003,291 ක ප්‍රමාණයෙන් රු.9,195,387 ක් හෙවත් සියයට 61 ක් වසරකට වැඩි ශේෂ වලින් සමන්විත වී තිබුණි.

(ආ) ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2011 වර්ෂයේ ලබාදුන් රු. 1,503,002 ක මුදලක් ව්‍යාපෘතිය අවසන් වී ඇතත් ආයතනය එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) උපයනවිට ගෙවීම් බදු ගිණුමේ හරට ඇති ශේෂය වන රු.69,659 ක මුදල හඳුනාගෙන පියවීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| අ) ස්ථාවර වත්කම් | 285,731,930 | I ස්ථාවර වත්කම් ලේඛණය |
| | | II භෞතික සත්‍යාපන වාර්තා |
| | | III හිමිකම් ඔප්පු |
| ආ) තොගය | 3,736,772 | භෞතික තොග සත්‍යාපන වාර්තා |
| ඇ) ලැබිය යුතු ගිණුම් | 149,420,095 | ශේෂ තහවුරු ලිපි |
| ඈ)කෙරීගෙන යන වැඩ | 2,055,721 | උපචිත කිරීමට අදාල ලිඛිත සාක්ෂි (සහතික කළ බිල්පත්) |

2.3 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත | |
| I. 39(1) | ආයතනය විසින් අමාත්‍යවරයා විමසා ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලයක් පත් නොකිරීම. |
| II. 39(2) | ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලයකට හෝටල් පාසලේ පරිපාලනය භාර නොකිරීම. |
| III. 39(3) | I ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලය පත් කරන ආකාරය සහ ආයතනය යටතේ ඇති පාසල් පරිපාලනය කළයුතු ආකාරය පිළිබඳ නියෝග සකස් නොකිරීම.<br><br>II සංචාරක කර්මාන්තය සහ හෝටල් පිළිබඳ පුහුණුව සැපයීම සඳහා පෞද්ගලික අයිතිය සහිත හෝටල් පාසැල් පිහිටුවීම කලමනාකරණය සහ මෙහෙයවීම සඳහා එම පාසල් පරිපාලනය කිරීම සඳහා නියෝග සකස් නොකිරීම. |

| | |
|---|---|
| (ආ) 1999 සංචාරක හෝටල් ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 02 වගන්තිය. | සංචාරක හෝටලයක් පවත්වාගෙන යාමේ දී ව්‍යාපාරය ලියාපදිංචි කල යුතු බව ඒ සඳහා බලපත්‍රයත් ලබාගත යුතු වුවද ආයතනයට අයත් හෝටලයට ලියාපදිංචි සහතික හා බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) මුදල් රෙගුලාසි 104(3),(4) | අවස්ථා දෙකකදී ආයතනය සතු වාහනයක් අනතුරු වලට ලක් වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිලි කිරීමක් හා ප්‍රාරම්භක වාර්තාවන් හා පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (II) මුදල් රෙගුලාසි 756 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 මැයි 08 දින දක්වාම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1999 ඔක්තෝම්බර් 8 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99(1.3.1) ඡේදය | ආයතනය විසින් කණ්ඩායම් තුනක් වෙනුවෙන් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාදෙන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

AGDSL
Auditor General's Department

(ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සඳහා ලේඛණයක් පවත්වා ගත යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

I. 4.2.5 වගන්තිය.

කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස පහත සඳහන් ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) ණයගැති, ණයහිමි කාල විශ්ලේෂණය.

(ආ) තොග කාල විශ්ලේෂණය.

(ඇ) පැරණි, යල්පැනගිය හා සෙමින් චලනය වන තොග සහ වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශය.

II. 7.2 වගන්තිය

ආයතනයේ ප්‍රධාන කාර්යයන් සඳහා අත්පොත් සහ විධිවිධාන සාදා තිබිය යුතු වුවත් ගබඩා සහ බීම හල සඳහා ඒ ආකාරයෙන් කටයුතු කර නොතිබුණි.

III 8.3.5 වගන්තිය

පෞද්ගලික කටයුතු සඳහා නිලවාහන පාවිච්චි කිරීමට හිමිකම නොලබන නිලධාරීන් 06 දෙනෙකුට අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ප්‍රවාහන දීමනා ලෙස රු. 7,180,560 ක් ගෙවා තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

---

සමාලෝචිත වර්ෂයේදී සමුද්‍රා හෝටලයේ රු. 15,003,291 ක ණයට විකුණුම් අනුමත කිරීමකින් තොරව සිදුකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.78,253,762 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.50,896,177 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,357,585 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට වඩා අපගමන බදු ආදායම රු.52,910,913 ක් සහ හෝටල් ආදායම රු.6,001,977 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

සමාලෝචිත වර්ෂයේ දී ආයතනයේ ආදායම රු.මිලියන 356 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 289 සමග සැසඳීමේදී සියයට 23.1 ක වර්ධනයක් විය. එසේම ඉකුත් වර්ෂයේ දී ඉගැන්වීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 238 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.මිලියන 278 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 16.8 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

3.3 වියදම් වල අසාමාන්‍ය වැඩිවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමතර රාජකාරී පැය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.3,969,065 ක් වැයකර තිබුණ අතර එය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 327 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

(ආ) කාර්යාල උපකරණ නඩත්තු වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.6,357,762 ක් වියදම් කර තිබුණ අතර එය පෙර වර්ෂයට වඩා සියයට 76 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 හෝටල් පාසල්වල කාර්යසාධනය

---

සිසුන් පුහුණු කිරීම පිළිබඳ කාර්ය සාධනය, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| වර්ෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| පාඨමාලා හැදෑරීමට සුදුසුකම් ලද සිසුන් ගණන | 768 | 883 | 1545 | 2056 | 2131 |
| පාඨමාලා අවසන් කල සිසුන් ගණන | 738 | 838 | 1464 | 1772 | ප්‍රතිඵල නිකුත් වී නොතිබුණි. |
| පාඨමාලා හැරගිය සහ අසමත් සිසුන් ගණන | 30 | 45 | 81 | 284 | 4 දෙනෙක් පාඨමාලාව හැර ගොස් තිබුණි. |

(අ) සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍යය පිරිවැය රු.130,642 වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.134,578 ක් විය.

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට අනුව සංචාරකයින්ගේ පැමිණීම 2016 වන විට මිලියන 2.5 දක්වා වර්ධනය කිරීමට ඉලක්ක කර තිබුණි. එම ඉලක්කයට සමගාමීව කර්මාන්තය සඳහා මානව සම්පත් 4000 ක් පුහුණු කිරීමට අපේක්ෂා කළ ද පවතින තත්ත්වය අනුව එම ඉලක්ක ඉටු කර ගැනීම ප්‍රශ්නකාරී වනබව පෙනීයයි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් හෝටල් කළමනාකරණ ආයතනයට ජාතික වෘත්තීය සුදුසුකම, (NVQ) ලබාගැනීම සඳහා උපදේශකත්වය හා සහායන් ලබා දුන්නද ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ජාතික වෘත්තීය සුදුසුකම සහිතව සහතික පත් නිකුත්කර නොතිබුණි.

(ආ) ඉංග්‍රීසි භාෂාව සංවර්ධනය සඳහා රු.1,210,000 ක මුදලක් වැයකර පවත්වනු ලැබූ පුහුණු වැඩසටහනට සහභාගී වූ සංඛ්‍යාවෙන් සියයට 43 ක් එම පාඨමාලාව සාර්ථකව නිමකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සමුද්‍රා හෝටලයේ සමාලෝචිත වර්ෂය තුළ ආදායම් ලබාගැනීම සඳහා හෝටල් කාමර දින 4745 තිබුණ අතර එයින් ආයතනය අලෙවිකර තිබුනේ හෝටල් කාමර දින 2015 පමණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

ආයතනය සතු කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණය කළමනාකරණය කර භාවිතයට නොගැනීම නිසා වර්ග අඩි 8547 ක පමණ ප්‍රමාණයක් පසුගිය වර්ෂ කිහිපයක සිට ඌන උපයෝජිතව තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන ගොඩනැගිල්ලේ වර්ග අඩි 4952 ක පමණ වූ ඉඩකඩ ප්‍රමාණයක් බාහිර ආයතන හා පුද්ගලයෙකු වෙත වෙන්කර තිබූ නමුත් ජලය, විදුලිය හෝ කුළී අයකිරීමකින් තොරව පරිහරණයට ඉඩ හැරීම නිසා ආයතනයට ආසන්න වශයෙන් රු. 16,379,700 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනය සතු වූ අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට අවදානය යොමු කර නොතිබුණු අතර ඉහළ ජංගම අනුපාතයක් පැවතීම නිසා දුර්වල මූල්‍ය කළමනාකරණයක් පවතින බව පෙන්නුම් කෙරුණි.

## 4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

---

බේකරි නිෂ්පාදන හා ලොන්ඩ්‍රි සේවාව මහජනයා වෙත විකිණීම සඳහා රු. මිලියන 11.70 ක ඇස්තමේන්තුවකට අලෙවිසැල් ඇති කිරීමට සැලසුම් කලද එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 160 ක් වන අතර දැනට ආයතනයේ තථ්‍ය කාර්ය මණ්ඩලය 112 ක් වේ. තනතුරු 52 ක පුරප්පාඩු සංඛ්‍යාවක් හා තනතුරු 4 ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ආ) බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඒක පුද්ගල කාර්ය මණ්ඩල පිරිවැය රු.823,138 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය රු.615,609 ක් විය.

## 4.8 වාහන උපයෝජනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතුව වාහන 02 ක් තිබුණ අතර එම වාහන ධාවනය කිරීමට අදාළව ධාවන පිරිවැය (ඉන්ධන සහ නඩත්තු වැය) එක් කිලෝමීටරයකට රු.126 ක ඉහළ අගයක් ගෙන තිබුණි..

Auditor General's Department
AGDSL

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කුළී පදනම මත ලබාගත් වාහන සඳහා රු.10,838,754 ක මුදලක් වැය කර තිබුණි. මෙම කුලී වාහන ධාවනය කළ දුර ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.9 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ගුණාත්මකභාවය සහ විශ්වාසවන්තභාවය

සමාලෝචිත වර්ෂය තුළදී සහ ඉකුත් වර්ෂවල දී පරිගණක හා පරිගණක මෘදුකාංග මිලදී ගැනීම සඳහා රු.මිලියන 45 ක් වැය කර තිබුණ ද ආයතනයේ පහත පරිදි කළමනාකරණ තොරතුරුවල අවශ්‍යතාවය හඳුනාගෙන විධිමත් තොරතුරු පද්ධතියක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

(අ) ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු පද්ධතියක්
(ආ) ගබඩා කටයුතු පිළිබඳ තොරතුරු පද්ධතියක්
(ඇ) කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පද්ධතියක්

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ දින 53 ක් ප්‍රමාද වී 2014 අප්‍රේල් 22 දිනදීය.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 රාජ්‍ය ව්‍යාපාර අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව ආයතනයේ සංයුක්ත සැලැස්ම අවම වශයෙන් අවුරුදු තුනක් සඳහා සකස් කර අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන පිටපතක් විගණකාධිපති වෙත භාරදිය යුතු වුවත් 2013 වර්ෂයට අදාළව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

---

ක්‍රියාකාරී සැලැස්ම තුළ ලඟාකරගත හැකි ඉලක්ක පැහැදිලි හා ප්‍රමාණාත්මකව සඳහන් කර නොතිබුණ අතර සැලැස්මේ අන්තර්ගත වූ පහත සඳහන් කරුණු සමාලෝචිත වර්ෂය තුළදී ලඟාකර ගත් බවට ප්‍රගති වාර්තා සකස්කර නොතිබුණි.

(අ) සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම.

(ආ) නව ඉගැන්වීමේ පහසුකම් ඇති කිරීම.

(ඇ) චීන භාෂාව ඇතුළු විදෙස් භාෂා ඉගැන්වීමේ අංශයක් ස්ථාපිත කිරීම.

5.4 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණනය රේඛීය අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබුව ද අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණන වැඩසටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.5 විගණන කමිටු

---

සමාලෝචිත වර්ෂය තුළ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 5 ක් පවත්වා ඇති අතර එහි දී කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සතුටුදායක මට්ටමක නොතිබුණි.

5.6 ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. ඡේදය ප්‍රකාරව ආයතනය සඳහා තුන් අවුරුදු ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.7 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේදී විෂයයන් 30 ක අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 21 සිට සියයට 410 දක්වා පරාසයක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5.8 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

ආයතනය විසින් 2011 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2014 මාර්තු 18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## 5.9 පාරිසරික සමාජ වගකීම් ඉටු කිරීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෝටල් කළමනාකරණ ආයතනයට අයත් සමුද්‍රා හෝටලය සඳහා පොදු වගකීම් රක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(ආ) සමුද්‍රා හෝටලයේ ජලය පරිභෝජනයට සුදුසු බවට ජල සාම්පල් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.